2026 ඔක්
188 කළාපය
DOP/NEWS/63/2026
පුවත්පතක් ලෙස මහ තැපැල්හලේ ලියාපදිංචි කරන ලදී
මිල රු. 50.00
සිංහල දෙමළ බසින් පළවන එකම සමාජවාදී පුවත්පත
එක්සත් සමාජවාදී පක්ෂයේ නිල ප්‍රකාශනය

# රතු තරුව
செந்தாரகை

ඇතුළත පිටු.......
- ජ.වි.ප.යේ දිවි නසා ගැනීම..
- හජප ආණ්ඩුවේ ශේෂ පත්‍රය...
- ශිෂ්‍ය අර්ධකාලීන රැකියා අරගලය...
- දේශගුණික අර්බුධය මාක්ස්වාදී ඇසින්...

# PSTA මර රකුසා
# මරා දැමීමට පෙළ ගැසෙව්!




ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් දිවි හිමියෙන් ආරක්ෂා කරන බවට පොරොන්දු දී බලයට පැමිණි මාලිමා ආණ්ඩුව කම්කරු පංතිය ඇතුළු ජනතාවගේ නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය මුලින්ම වළ දැමීමට පියවර ගෙන ඇත.

ත්‍රස්තවාදයෙන් රාජ්‍ය ආරක්ෂා කිරීමේ පනත නමින් ආණ්ඩුව ගෙන ඒමට කටයුතු කර තිබෙන නව පනත ජේ. ආර්. ජයවර්ධන විසින් නීතිගත කළ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතටත් වඩා භයානකය. මෙය ක්‍රියාත්මක වූ පසු ජනතාවට පත්‍රිකා බෙදීම, උද්ඝෝෂනය කිරීම, රැස්වීම් පැවැත්වීම, වැඩවර්ජනය කිරීම හා මෙම පුවත් පතේ පිටුවක පළ කර තිබෙන ලිපිය පවා මෙම පනත සම්මත වුණාට පසුව ත්‍රස්තවාදි ක්‍රියාවක් ලෙස සළකා ලියුම්කරුව අත්අඩංගුවට පත් කළ හැකිය. මහ පාරේ දී පුද්ගලයෙකු තමන්ගේ අයිතිය ඉල්ලා උද්ඝෝෂණයක යෙදීම පවා ත්‍රස්තවාදි ක්‍රියාවක් වන්නේ ය.

ඉහත දක්වා ඇති පරිදි මෙම පනතට අනුව සාමාන්‍ය විරෝධය දැක්වීමක් වැනි ඕනෑම සරළ විරෝධයක් සිදු කිරීමේ දී පොලීසියට, හමුදාවට හා වෙරළාරක්ෂක නිලධාරියෙකුට පවා කිසිදු අධිකරණ තීන්දුවක් නොගෙන ඕනෑම පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට හා රඳවා තබා ගැනීමට බලය දී ඇත. මේ පනත මගින් ත්‍රස්ත ක්‍රියාවක් ලෙස සාමාන්‍ය විරොධය දැක්වීමක් හෝ ලිපියක් ලිවීම පවා හඳුන්වා දීම හරහා ජනතාව මෙතෙක් භුක්ති විඳින ලද සියළු ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සහමුලින්ම අහෝසි කිරීමට පියවර ගෙන ඇත. රට තුල ත්‍රස්තවාදයක් පවතින බවට කිසිදු හෝඩුවාවක් නොමැති පරිසරයක ජනතාවගේ කර මතින් බලයට පත් වූ ආණ්ඩුව මේ අන්දමට ඉතා භයානක පනතක් නීතිගත කිරීමට කටයුතු කරන්නේ ඇයි ද යන ප්‍රශ්ණය මාලිමා ආණ්ඩුවට ඡන්දය දුන් ජනතාව ප්‍රශ්ණ කළ යුතුව ඇත.

ඇත්ත කාරණය වන්නේ මේ ආණ්ඩුවේ අසමත් ක්‍රියා කලාපයට එරෙහිව රට පුරා ජනතා විරෝධය නැගී ඒමට පටන් ගෙන ඇති බවත් එය දරුණු ලෙස මර්ධනය කිරීමට කටයුතු කිරීමට ඔවුන්ට අවශ්‍යවී තිබිම ය. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 22 වන සංශෝධනය සම්මත කර ගැනීමට ආණ්ඩුව දැරූ පිපාසයම PSTA පනත සම්මත කර ගැනීමටත් ඔවුන් යොදා ගැනීම උත්ප්‍රාසජනකය. මෙම කුරිරු පනත පරාජය කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියළු බලවේග පක්ෂ පාඨ නොබලා දැවැන්ත මහජන ව්‍යාපාරයකට කැඳවිය යුතු බව රතු තරුව අවධාරණය කර සිටී.

## PTA පනතටඅනුර කුමාර යක්ෂ දත් සවි කරයි

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන බවට දිව්රා පොරොන්දු දුන් අනුර කුමාරගේ ආණ්ඩුව එය අහෝසි කිරීමට පියවර ගන්නවා වෙනුවට අත්අඩංගුවට පත්වන අය රැඳවුම් නියෝග මත රඳවා තබා ගැනීම සඳහා අලුතෙන් රැඳවුම් මධ්‍යස්ථානයක් ජනාධිපතිවරයා විසින් ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ඇත. නාරාහේන්පිට කම්කරු අමාත්‍යංශය හා කම්කරු දෙපාර්තමේන්තුව පිහිටි පුද්ගලයින් රඳවා තබා ගනු ලැබු මධ්‍යම අපරාධ කාර්යංශය මේ සඳහා මේ සඳහා ඔහු විසින් ගැසට් පත්‍රය මගින් නම් කර ඇත.

ජනතා විමුක්ති පෙරමුණ නායකත්වය දෙනු ලබන මාලිමා ආණ්ඩුවට නිල වශයෙන් රාජ්‍ය ත්‍රස්තවාදය පිළිගෙන කටයුතු කරන බව මෙම පියවර මගින් ජනතාව ඉදිරියේ හෙළිදරව් ඇත. විශේෂයෙන් තේරුම් ගත යුතු කරුණු වන්නේ ත්‍රස්තවාදයෙන් රාජ්‍ය බේරා ගැනීමේ පනත නමින් ඉතා භයානක පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන පසු බිමක එය සම්මත කර ගන්නා තුරුවත් ඉවසා සිටීමට නොහැකි තරම් තදියමක් ජනාධිපති අනුර කුමාරට ඇතිවී තිබෙන බව ය. සිස්ටම් චේන්ජ් කිරීම කෙසේ වෙතත් පරණ සිස්ටම් එක එයටත් වඩා හොඳින් මර්ධනකාරි රාජ්‍ය යන්ත්‍රයේ උවමණාව සඳහා යොදාගන්නා බව මාලිමා ආණ්ඩුව වෙනුවෙන් කේවට්ටකම් කරන ඊනියා පඩිවරුන් තේරුම් ගත යුතුව ඇත.

## අනෝජන් සිවරාසා වහා නිදහස් කරනු!



සමාජ මාධය මගින් කරන ලද සටහනක් හේතුකොට ගෙන මුස්ලිම් ආගමට අපහාස කළේය යන චෝදනාව මත සෞදි අරාබිය විසින් අනෝජන් සිවරාසාට මරණ දඬුවම ලබා දී ඇත. දේශීය හා විදේශීය සංවිධාන රැසක් ඔහුට පවරා තිබෙන මරණ දඬුවම ඉවත් කර නිදහස් කරන ලෙස සෞදි බලධාරින්ගෙන් ඉල්ලා තිබේ. ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් ද මෙම ඉල්ලීම ඉදිරිපත් කර ඇති බව වාර්ථා වේ.

මේ අතර ඔහු රඳවා සිටින සිර මැදිරිය තුල දී ඔහුට බරපතල ලෙස පහර දී ඇති බවත් ඔහු එයින් තුවාල ලබා ඇති බව ද වාර්තා වේ. අනෝජන් සිවරාසා ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු විද්‍යාව හදාරන සිසුවෙකු බවද වාර්තා වේ. ඔහුගේ ජීවිත බේරා ගැනීමට නම් මෙම ඔක්තෝබර් 17 වන දිනට පෙර අභියාචනා ඉදිරිපත් කළ යුතු බව වැඩි දුරටත් වාර්තා වේ. මානව අයිතීන් සුරැකීමට පොරොන්දු දී බලයට පත් ආණ්ඩුව මෙම බරපතල කටයුක්ත සම්බන්ධයෙන් ඇඟ බේරා ගැනීම පිණිස කටයුතුකරනවා හැර එය ලාංකිකයෙකුට සිදුවන බරපතල අසාධාරණයක් ලෙස සළකා කටයුතු කරන බවට පෙනෙන්නට නැත. අනෝජන් සිවරාසාගේ මරණීය දන්ඩණය අහෝසි කර ඔහුට පූර්ණ නිදහස ලබා දෙන ලෙසට බල කිරීම සඳහා මහජන ව්‍යාපාරයක් ගොඩ නැගීමේ අවශ්‍යතාවය රතුතරුව අවධාරණය කර සිටී.

**සැබෑ වෙනසක් වෙනුවෙන් සමාජවාදී වැඩපිළිවෙල දිනවමු...**

රතු තරුව செந்தாரகை
53/6 ඊ.ඩී.දාබරේ මාවත, කොළඹ 05.
E.mail – unitedsocialists@gmail.com
Tel – 011 2504647
එක්සත් සමාජවාදී පක්ෂයේ වෙබ් අඩවියට පිවිසෙන්න
www.lankasocialist.com

# ★ජ.වි.ප.යේ★ දිවි නසා ගැනීම

බොහෝ දේශපාලන ව්‍යාපාර බලය ලබා ගැනීමට පෙර හුදෙක් පවතින ක්‍රමවේදය සහ පාලකයින් විවේචනය කිරීම පමණක් සිදුකරයි.නමුත් එම විවේචන මතම යැපෙමින් සිටින බලවේගයකට මැතිවරණයකින් නොසිතූ බලයක් ලැබුණු විට ඔවුන් දැඩි අර්බුදයකට ලක්වේ.මන්ද එම පරිවර්තනය සඳහා ජනතාවගේ මතය හා ශ්‍රමය දෘෂ්ටිවාදිමය වශයෙන් ඔවුන් සංවිධානය කර නොමැති නිසාත් බලය ලබා ගත් පසු කළ යුතු ප්‍රායෝගික වැඩපිළිවෙලක්ද ඔවුන් සතුව නොමැති වීමත්ය.එහි ප්‍රතිඵලය වන්නේ තමන්ගේ ක්‍රියාමාර්ගවල හිස් බව වසා ගැනීමේ අර්බුදයට ඔවුන් ගොදුරු වීමයි. ලෙනින් එය හැඳින්වූයේ සැබෑ ප්‍රතිපත්ති පාවාදී බලය වෙනුවෙන් කරන අවස්ථාවාදය ලෙසයි. ජ.වි.ප.ය ප්‍රමුඛ මාලිමා ආණ්ඩුව අද මුහුණ දී සිටින්නේ මෙම දේශපාලන යථාර්ථයටයි. ලෙනින් වැඩිදුරටත් ප්‍රකාශ කළේ න්‍යාය යනු ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය සඳහා පවතින සිතියමක් බවත් වැරදි සිතියමක් ගෙන නුපුරුදු නගරයක ගමන් කරන පුද්ගලයෙකු ලෙස වැරදි න්‍යායක් මත පිහිටා භාවිතයට බසින දේශපාලන ව්‍යාපාරයක්ද අනිවාර්යෙන් ප්‍රපාතයට ඇද වැටෙන බවයි.

පදනම දෝෂ සහිත වන විට එමගින් උපදින ක්‍රියාවලියද ව්‍යසනයකින් කෙළවර වීම වැළැක්විය නොහැකි බව අවධාරණය කෙරුණි. ජ.වි.ප.ය ආරම්භයේ සිටම මේ දක්වා ඔවුන්ගේ දේශපාලන මතවාද ගතික ස්වභාවයකින් යුක්ත විය. විටෙක බලය ලබා ගැනීමේ උපාය මාර්ගය සන්නද්ධ අරගලය ලෙස විශ්වාස කළ ඔවුන් විටෙක පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි විශ්වාසය තැබූහ. සභාග දේශපාලනය තුළින් බිහිවන පංති සහයෝග දේශපාලනය දැඩිව ප්‍රතික්ෂේප කල ජවිපය චන්ද්‍රිකා කුමාරතුංග, මහින්ද රාජපක්ෂ සමඟ සභාග දේශපාලනයට ඇතුළු වෙමින් පන්ති සහයෝගී දේශපාලනයට ප්‍රවේශ විය. නව ලිබරල් වාදය හා IMF ලෝක බැංකු න්‍යාය පත්‍රයන් දැඩිව විවේචනය කල ජ.වි.ප.ය අද වන විට සිය මාර්ගෙ ්පදේෂකයා වශයෙන් එම මූල්‍ය ආයතන තෝරා ගනිමින් ද එපමණක් නොව ඇමරිකානු අධිරාජ්‍යවාදය හා ඉන්දියානු ව්‍යප්තවාදය ගැන කෑමොර දුන් ජ.වි.ප.ය අද වන විට එම ධනපති රාජ්‍යන් සමග හොර ගිවිසුම් වලට එළඹෙමින් සිටී. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය ඉන්දියාව හා චීනය අතර වෙන්දේසියේ යෙදෙමින් සිටී.පොදු රාජ්‍ය සම්පත් විකිණීමට එරෙහිව දිවි හිමියෙන් කැප වන බව සපථ කරන බව පැවසූ ජ.වි.ප.ය අද වන විට රාජ්‍ය සම්පත් සූක්ෂම ලෙස පෞද්ගලීකරණයට ලක් කරමින් සිටී.මෙම සියලු සාධක කැටි කොට ගත් කල පෙනී යන්නේ ජ.වි.ප.ය මෙතෙක් වංචනික ලෙස පොරවාගෙන සිටි වාම වාදී අවසන් සළුපිලිත් ගලවා දමා ඔවුන්ගේ දේශපාලනික වශයෙන් සැබෑ දේශපාලන නිරුවත ජනතාව ඉදිරියේ ප්‍රදර්ශනය කරමින් සිටී.

ධනේශ්වර කඳවුරේ ලිබරල් මතධාරිණියක් වන හරිනි අමරසූරිය ප්‍රමුඛ කණ්ඩායමක් සමඟ සන්ධානගත වෙමින් පිහිටුවා ගත් මාලිමා ආණ්ඩුව බලයට ගෙන ඒමට දරදිය ඇද්ද නිර්මාල් දේවසිරි අද පාපොච්චාරණයේ යෙදෙමින් ප්‍රකාශ කරන්නේ මේ බේදවාචකයයි. ප්‍රසිද්ධියේ පවසන්නේ මතු වී ඇති ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට තබා ප්‍රශ්නයේ ස්වරූපය හඳුනා ගැනීමට තරම්වත් නොහැකි අසමත් ආණ්ඩුවක් බිහිවී ඇති බවයි.

නව ලිබරල්වාදී ආර්ථික මඩ ගොහොරුවේ එරී ඇති මාලිමා ආණ්ඩුව සිය මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශය වන පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ජනතාවට නොලැබෙන ආණ්ඩුව කරවන අයට පමණක් හිමිවන වරප්‍රසාදයක් බවට පත් කරමින් සිටී. පුනරුදය ජනතාව මරණ මංචකය දක්වා කැඳවා ඇති ආකාරය පහත සඳහන් සරළ සංවේදී තොරතුරුවලින් පැහැදිලි වේ. 2026 ලෝක බැංකු වාර්තාවට අනුව ජනගහනයෙන් 65% පමණ දරිද්‍රතා මට්ටමේ පසුවේ. අවුරුදු 05 ට අඩු දරුවන්ගේ 33% ක් ප්‍රෝටීන් ඌණතාවයෙන් පසුවේ. පසුගිය මාස 5 ට පමණක් කෝටි පහළොස් දහසක රත්තරන් බඩු ජනතාව උගස්කොට ඇත. උගත් තරුණ විරැකියා අනුපාතය 43% පමණ ඉහළ ගොස් ඇති අතර උද්ධමන අනුපාතය 8% දක්වා වර්ධනය වී තිබේ.

ඉහත අයුරින් මතුවන ආර්ථික අර්බුදය හමුවේ ඉදිරියේදී මතුවිය හැකි ආණ්ඩු විරෝධී අරගලයන් මර්ධනය කිරීම සඳහා පෙර ආණ්ඩු වලටත් වැඩියෙන් මාලිමා ආණ්ඩුව මර්ධනීය යාන්ත්‍රනය ක්‍රියාත්මක කරමින් සිටී. 22 වන සංශෝධනය හරහා අධිකරණයට අත තබමින්ද නව PSTA පනත් වැනි ව්‍යවස්ථාපිත මර්ධනීය මෙවලම් හරහාද සමාජ මාධ්‍ය පාලනය කිරීමටද උත්සහ දරමින්ද පොලිස් රාජ්‍යයක් නිර්මාණය කරමින්ද ආණ්ඩුව මේ පෙළගැසෙමින් සිටින්නේ ඉදිරියේදී ඇතිවිය හැකි ආණ්ඩු විරෝධී අරගලයන් රාජ්‍ය මර්ධනීය යාන්ත්‍රණය හරහා පොඩි පට්ටම් කරමින් ඒකාධිපති පාලනයක් කරා ගමන් කිරීමටය.

ජ.වි.ප.ය සිය ගමන් මගේ දේශපාලන දිවිනසා ගැනීමේ ප්‍රවේශයකට ලගා වෙමින් පවතින බව පෙනේ. 1971 හා 1989 දී ජ.වි.ප.ය විසින් දියත් කල සන්නද්ධ කැරලි දෙකේදී තාරුණ්‍ය යේ සැලකිය යුතු කොටසක් ධනපති රාජ්‍ය ගිලටීනයට බිලි දුන්නද ජ.වි.ප.ය කෙරෙහි යම් සමාජ අනුකම්පාවක් ඇති වී තිබුණේ එම ජීවිත පරිත්‍යාගන් වඩාත් යහපත් සමාජයක් වෙනුවෙන් කැපකලාය යන සමාජ මතය ගොඩනැගී තිබූ බැවිනි. එහෙත් මෙවර ජ.වි.ප.යට එවැනි සමාජ අනුකම්පාවක් ඉතිරි කර ගෙන නොමැත. බොරුවෙන් උපන් බොරුවෙන් ජීවත් වන ආණ්ඩුවක්ය යන සමාජ මතය ක්‍රමයෙන් වැඩෙමින් පවතී. ආර්ථික අර්බුධයත් සමග මතුවන ඔවුන්ගේ දේශපාලන පරිහානිය කළමණාකරණය කරගත නොහැකි මට්ටමකට වර්ධනය වී තිබේ.

අවසාන වශයෙන් සදහන් කල හැක්කේ දේශපාලනයේ "සැබෑ දිවිනසා ගැනීම" ආරම්භ වන්නේ තමන්ගේ දේශපාලන සත්‍ය ජනතාවට පැහැදිලි කිරිම වෙනුවට ජනතාවගේ කැමැත්ත හා විශ්වාසය දිනා ගැනීම සඳහා ජනතාවට බොරු කියමින් තමන්ගේ දේශපාලන ස්ථාවරයන් වෙනස් කිරීමට පටන් ගත් දා සිට බව ජ.වි.ප.ය අවබෝධ කර ගත යුතුය.



# මෛත්‍රෙයි රාමකිෂ්ණන් සහ
## වර්ගවාදී දේශපාලනයේ හෙට දවස

තමන් කවුරුන්දැයි පැවසීම මිනිසෙකුගේ මූලික අයිතියකි. එහෙත් ශ්‍රී ලංකාවේ ජාතිවාදී දේශපාලනයේ කොටසක් ඉදිරියේ එම අයිතිය පවා අද ප්‍රශ්නයක් බවට පත්ව තිබේ. කැනඩාවේ උපත ලද දෙමළ සම්භවයක් ඇති නිළි මෛත්‍රෙයි රාමකිෂ්ණන් තම දෙමළ අනන්‍යතාවය පිළිබඳව කළ ප්‍රකාශයන් හේතුවෙන් මුහුණ දුන් සමාජ මාධ්‍ය ප්‍රහාරය එයට නවතම උදාහරණයකි.

මෛත්‍රෙයි රාමකිෂ්ණන් Never Have I Ever හරහා ලෝක ප්‍රේක්ෂකයන් අතර ජනප්‍රිය වූ අතර, 2026 සැප්තැම්බර් 18 දා Netflx· වෙත නිකුත් වූ Best of the Best චිත්‍රපටයේ ප්‍රධාන චරිතයක් නිරූපණය කරයි. චිත්‍රපටයේ ඇයගේ චරිතය තම අනන්‍යතාවය පැහැදිලි කරන අවස්ථාවේ "I'm Tamil, My family's from Tamil Eelam" යන දෙබස භාවිත කරයි. එය හුදෙක් තිර රචනයක වාක්‍යයක් නොව, රාමකිෂ්ණන්ගේ සැබෑ සංස්කෘතික අනන්‍යතාවය පිළිබඳ ඇයගේම ප්‍රකාශනයක් බවට පත්විය. ඇය තමන්ගේ රට කැනඩාව බවත්, තම සංස්කෘතික මූලයන් දෙමළ බවත් මීට පෙරද ප්‍රසිද්ධියේ පවසා තිබේ.

මෙම ප්‍රකාශය සිංහල සමාජ මාධ්‍ය අවකාශය තුළ ප්‍රසිද්ධියට පත් වීමත් සමග මෙම අනන්‍යතාවය ප්‍රකාශයට පත් කිරීම ලාංකේය වර්ගවාදී කොටස් වලට පිළිගත නොහැකි දෙයක් විය. ඒ අනුව මෛත්‍රෙයි රාමකිෂ්ණන්ට එරෙහිව සමාජ මාධ්‍ය අවකාශය තුළ වර්ගවාදී ප්‍රහාර එල්ල කිරීමේ ප්‍රවණතාවක් ආරම්භ විය. සංවිධානාත්මකව සමාජ මාධ්‍ය පිටු හරහා ඇයට විරුද්ධව ද්වේශ සහගත අපහාස, ලිංගික තර්ජන "Post" Meme" "Reels" ඉදිරිපත් කෙරිණි. ඇතැම් සිංහල ජාතිකවාදී සමාජ මාධ්‍ය කණ්ඩායම් විසින් මෙය දේශපාලන ප්‍රහාරයකට හරවා තිබේ. එහි වඩාත් පැහැදිලි උදාහරණයක් වන්නේ The Sri COM වැනි සමාජ මාධ්‍ය පිටුය. Jaffna Monitor විසින් පරීක්ෂා කර වාර්තා කර ඇති පෝස්ට් අනුව, එම Facebook පිටුව තම අනුගාමිකයන්ට Best of the Best චිත්‍රපටයට iMDb හි එක් තරුව ලබාදෙන ලෙස සංවිධානාත්මකව කැඳවා තිබේ. තවද, ChatGPT හෝ Google Gemini භාවිත කර මෛත්‍රෙයිගේ රංගනය විවේචනය කරන සෘණාත්මක reviews නිර්මාණය කර ඒවා iMDb වෙත පළ කරන ආකාරය පිළිබඳ උපදෙස්ද ලබාදී තිබේ.

මෙය සාමාන්‍ය චිත්‍රපට විචාරයකට වඩා වෙනස් ක්‍රියාවකි. කලා කෘතියකට කැමති නොවීමේ අයිතිය සෑම ප්‍රේක්ෂකයෙකුටම තිබේ. නමුත් කලා කෘතියක ගුණාත්මකභාවය නොව, එහි නිළියකගේ වාර්ගික අනන්‍යතාවය ඉලක්ක කරගනිමින් සංවිධානාත්මකව ratings සහ reviews මෙහෙයවීම වෙනස් ප්‍රශ්නයකි. මෙහිදී The Sri COM සම්බන්ධ චෝදනාව තවදුරටත් බරපතළ වන්නේ එම ක්‍රියාව පිළිබඳ පෝස්ට් සහ comments සම්බන්ධයෙන් මාධ්‍යමය පරීක්ෂණයක් සිදු කර තිබීමත්, iMDb විසින්ම Best of the Best සඳහා "Unusual activity" හඳුනාගෙන ඇති බව ප්‍රකාශ කර තිබීමත් නිසාය. තවද, iMDb හි පරිශීලකයෙකු ඉදිරිපත් කළ පැමිණිල්ලක ශ්‍රී ලංකාවෙන් ලැබුණු ratings අතර අසාමාන්‍ය ලෙස එක්-තරු ratings වැඩිවීම පිළිබඳ සංඛ්‍යාත්මක අවධානයක් යොමු කර තිබුණි. එය තනි පුද්ගලයකුගේ චිත්‍රපට විවේචනයකට වඩා වෙනස් රටාවක් පිළිබඳ ප්‍රශ්නයක් මතු කරයි.

වඩාත් බරපතළ කරුණ වන්නේ මෛත්‍රෙයි රාමකිෂ්ණන්ගේ දෙමළ අනන්‍යතාවය LTTE සමඟ සෘජුව සම්බන්ධ කිරීමට ගත් උත්සාහයයි. Jaffna Monitor හි පරීක්ෂණයට අනුව The Sri COM ඇතුළු ඇතැම් පිටු ඇය LTTE ආධාරකරුවෙකු ලෙස හඳුන්වා තිබුණද, එම වාර්තාව ඇය LTTE වෙත සහාය පළ කළ ප්‍රකාශයක් හඳුනාගෙන නොමැති බවද සඳහන් කරයි. මෙහිදී අපට මූලික ප්‍රශ්නයක් මතු වේ. දෙමළ අනන්‍යතාවය ප්‍රකාශ කිරීම LTTE දේශපාලනයට සහාය දැක්වීමක්ද ? එසේ නම් ලෝකයේ දෙමළ ජනතාවගෙන් කී දෙනෙකුගේ සංස්කෘතික අනන්‍යතාවය දේශපාලන අපරාධයක් බවට පත් කළ හැකිද ?

තව ද ඊළාම් අනන්‍යතාවය යන්න සත්‍ය වශයෙන් නොපවතින්නක් ලෙස වර්ගවාදී කොටස් ප්‍රකාශ කරනු ලැබීය. ශ්‍රී ලාංකේය දෙමළ ප්‍රජාවගේ අනන්‍යතාවය ගොඩ නගා ගත යුත්තේ සිංහල බෞද්ධ වර්ගවාදී කොටස් වලට අනුව බව එහි අදහස විය. එමෙන්ම ඇතැම් වර්ගවාදී ශාස්ත්‍රීය උගතුන් ඊළාම් යන වචනය සහ අනන්‍යතාවය පිළිබඳ ව්‍යාජ මත පළ කිරීමට ඉතිහාසකරණය සිතා මතා වෙනස් කිරීමට වැඩ කටයුතු කරන ලද අතර එයට එරෙහි කොටස් වලට වර්ගවාදී ප්‍රහාර එල්ල කිරීම ද සමාජ මාධ්‍ය අවකාශය තුළ දී සිදු විය.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළ ජාතිවාදී දේශපාලනය විසින් සිංහල හා දෙමළ වැඩ කරන ජනතාව අතර ඇති පොදු සමාජ-ආර්ථික ගැටලු යටපත් කරමින් ජාතික අනන්‍යතාවය දේශපාලන අවියක් බවට පත් කළ අවස්ථා අපමණය. අද ඩිජිටල් යුගයේ එම ක්‍රියාවලිය නව තාක්ෂණයන් සමඟ තවත් වේගවත් වී තිබේ. Facebook, iMDb සහ generative AI වැනි මෙවලම් දැන් දේශපාලන ප්‍රචාරණයේ නව ක්ෂේත්‍ර බවට පත්ව ඇත. එබැවින් මෛත්‍රෙයි රාමකිෂ්ණන්ට එරෙහි මෙම සිදුවීම එක් නිළියකගේ ප්‍රසිද්ධිය පිළිබඳ ගැටලුවක් පමණක් නොවේ. එය ශ්‍රී ලංකාවේ ජාතිවාදී දේශපාලනය ඩිජිටල් අවකාශය තුළ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ වැදගත් උදාහරණයකි.

මාක්ස්වාදී දෘෂ්ටිකෝණයකින් මෙය තේරුම් ගැනීමේදී තවත් ප්‍රශ්නයක් මතු වේ. ජීවන වියදම, රැකියා අනාරක්ෂිතභාවය, අධ්‍යාපනික අර්බුද සහ ආර්ථික අසමානතාව වැනි සැබෑ ප්‍රශ්නවලට මුහුණ දෙන වැඩ කරන ජනතාව එකිනෙකාට එරෙහිව ජාතිය හා අනන්‍යතාව මත බෙදීම, ඔවුන්ගේ පොදු පන්ති අත්දැකීම යටපත් කරයි. මෛත්‍රෙයි තමන් දෙමළ යැයි පැවසීම ඇගේ අයිතියකි. සිංහලයෙකුට සිංහලයෙකු ලෙස තම අනන්‍යතාවය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය මෙන්ම එයද ආරක්ෂා කළ යුතුය. අද අවශ්‍ය වන්නේ අනන්‍යතාවයන්ට දඬුවම් කරන ජාතිවාදයක් නොව, විවිධ අනන්‍යතාවයන්ට සමාන ගෞරවය ලබාදෙන සමාජයකි. සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුළු සියලු වැඩ කරන ජනතාවගේ සැබෑ සතුරා එකිනෙකා නොව, ඔවුන් මුහුණ දෙන සමාජ හා ආර්ථික පීඩනයයි. ජාතිවාදී බෙදීම්වලට එරෙහිව පන්ති එකමුතුව ගොඩනැගීම අද දේශපාලනිකව අත්‍යවශ්‍ය වන්නේ එබැවිනි.

*චමෝද් නිරෝධ අල්විස්*

# අනුර කුමාර හා NPP ආණ්ඩුවේ

# වසර දෙකක ශේෂ පත්‍රය

අනුර කුමාර 2024 සැප්තැම්බර් මස 21 පැවැති ජනාධිපති වරණයෙන් ජයග්‍රහණය කර ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දෙනු ලැබුවේ සැප්තැම්බර් මස 23 වෙනිදා ය. ලාංකීය මැතිවරණ ඉතිහාසය තුළ සම්ප්‍රදායික ධනපති පක්ෂයන් වූ එජාප හා ශ්‍රීලනිප යන පක්ෂ මෙන්ම එයින් බෙදී ගිය පක්ෂ හැරුණු විට එයින් පරිබාහිරව බලය ලබා ගත් එකම පක්ෂය ලෙස ජාතික ජන බලවේගය ඉතිහාසයට එක් විය. එපමණක් නොව කොළඹ කේන්ද්‍රිය ප්‍රභූ ධනපති පංතිය තුළ මෙතෙක් පැවැති රාජ්‍ය බලය ග්‍රාමීය තරුණ ජනතාව මත පදනම්ව කටයුතු කළ නාමික වශයෙන් මතු පිටින් මාක්ස්වාදයට අනුගත බව පෙන් වූ ජනතා විමුක්ති පෙරමුණ 2024 ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රධාන ක්‍රියාකාරි සාධකය විය. මෙම මැතිවරණවල දී ජනතා ආකර්ශණය දිනා ගැනීම සඳහා ඔවුන් විසින් වේදිකාවල නොදුන් පොරොන්දුවක් නැති තරම් ය. ඒ අතර කැපී පෙනුනේ ඔවුන්ගේ නිල මැතිවරණ ප්‍රකාශණය වන පොහොසත් රටක් හා ලස්සන ජීවිතයක් යන ලියවිල්ල හරහා ජනතාවට පොරොන්දු තොගයක් ලබා දුන්නා ය. ඇත්ත වශයෙන් මාලිමා ආණ්ඩුවේ නායකයින් මේ වන විට හැසිරෙන්නේ ඔවුන් එවැනි පොරොන්දු කිසිවක් නොදුන් අය ලෙස ය.

ජාතික ජන බලවේගයේ පොරොන්දු ගැන ජනතාව මේ වන විට තේරුම් ගෙන සිටින බැවින් මෙම ලිපියේ ඒ ගැන සාකච්ඡා කිරීමට අදහස් නොකෙරේ. එසේ වුව ද ජනතා විමුක්ති පෙරමුණ ආරම්භයේ සිටම පෙනී සිටි එක් ප්‍රධාන දෙයක් ගැන මෙහිලා සඳහන් කළ යුතු ය. එනම් ජේ ආර් ජයවර්ධන විසින් 1978 දී රටට හෙනපතයක් ලෙස නිර්මාණය කළ ඒකාධිපති බලතල සහිත ව්‍යවස්ථාව සම්බන්ධව ය. NPP ය රටට ඉදිරිපත් කළ ''පොහොසත් රටක් -ලස්සන ජීවිතයක්'' මැතිවරණ පොරෙන්දු ප්‍රකාශණයේ 194 පිටුවේ මෙසේ සඳහන් කර ඇත.

*"විධායක ජනාධිපති ආණ්ඩුක්‍රමය අහෝසි කොට පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත කිරීම හා විධායක බලතල රහිත ජනාධිපතිවරයෙක් පත් කිරීම, එය මහ ජනතාව වෙත ඉදිරිපත් කර සංවාදයකින් අනතුරුව අවශ්‍ය වෙනස්කම් සිදුකොට ජනමත විචාරනයක දී සම්මත කරගනු ඇත''*

මෙම පොරොන්දුව ඉටු කිරීම සඳහා මාලිමා ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අවසර ගතයුතු නැත. එසේම ජනමත විචාරණයක් පැවැත්වීම සඳහා වැය වන මුදල අනෙක් ව්‍යාපෘති සමග සැසඳීමේ දී අති දැවන්ත මුදලක් ද නොවේ. නමුත් අනුර කුමාර ඇතුළු ආණ්ඩුවේ නායකයින් වසර දෙකක් ගෙවී යද්දිවත් ඒ ගැන වචනයක්වත් කථා නොකිරීමට ප්‍රවේශම් වෙති. මෑතක දී කැබිනට් මාධ්‍ය ප්‍රකාශක නලින්ද ජයතිස්ස ඇමතිවරයා ප්‍රකාශ කළේ අලුත් ව්‍යවස්ථාවක් ගැන මේ දක්වා කැබිනෙට්ටුව තුළ සාකච්ඡා කර නොමැති බව ය. 1970 මැයි වලදී බලයට පත් වූ සිරිමා බණ්ඩාරණායකගේ ආණ්ඩුව වසරක් යෑමට පෙර 1971 දී ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් පත් කර 1972 මැයි වලදී ජනරජ ව්‍යවස්ථාව සම්මත කරන ලදී. එසේම 1977 ජූලි මස බලයට පත් වූ ජේ ආර් ජයවර්ධන 1978 සැප්තැම්බර් මස දී විධායක බලතල සහිත වර්තමානයේ පවතින ව්‍යවස්ථාව සම්මත කර ගත් බව තේරුම් ගත යුත්තේ ඒ සඳහා අවශ්‍යතාවයක් ඇත්නම් ආණ්ඩුවක් බලයට පත් මුල් කාලයේ තුළ එය කිරීමට පියවර ගත යුතු බව ඉතිහාසය පෙන්නුම් කරන නිසා ය.

එළෙස ජනතාවට දුන් පොරොන්දුව ඉටු නොකර සිටිනවා පමණක් නොව විධායක ජනාධිපති ධූරයේ බලතල අසීමිතව උපයෝගි කර ගනිමින් අනුර කුමාර කටයුතු කරන බව පැහැදිළිය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදා ගනිමින් විවිධ කොටස් ජනාධිපති නියමය පරිදි අසීමිත කාලයක් රඳවා ගැනිමට කටයුතු කරන්නේ කිසිදු විලි ලැජ්ජාවක් නැති අයෙකු ලෙස ය. එපමණක් නොව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) අහෝසි කිරීම වෙනුවෙන් පසුගිය කාලය පුරාම පෙනී සිටි අනුර කුමාරගේ ආණ්ඩුවට දැන් ත්‍රස්තවාදයෙන් රජය ආරක්ෂා කිරීමේ පනත (PSTA) නමින් අලුත් පනතක් ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ඇත. ඇත්ත වශයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතටත් වඩා ඉතා භයානක බලතල මේ ආණ්ඩුව විසින් හඳුන්වා දීමට පියවර ගෙන තිබෙන නව පනතට අඩංගුවී ඇත. විහිලුවට කාරනය නම් මෙම පනත රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුව විසින් හඳුන්වා දීමට පියවර ගත් අවස්ථාවේ දී හරිනි අමරසූරිය විජිත හේරත් යන වත්මන් ආණ්ඩුවේ නායකයින් ශ්‍රෙෂ්ඨාධිකරණයේ පෙත්සම් දැමීමට පියවර ගත් බව පවා ඔවුනට අමතකවී තිබීම ය.

අපේ ඇසින්



ආණ්ඩුවේ අසමත්කම වසා ගැනීම සඳහා සිදුකරනු ලබන එකම කටයුත්ත රාජපක්ෂවරුන්ට එරෙහිව නඩු පවරා ඔවුන්ව සිරගත කිරීම්වලට දෙන විශාල ප්‍රචාරයයි. රාජපක්ෂවරු ඇතුළු මෙතෙක් රට පාලනය කළ ධනපති හැතිකරය රටට සිදුකර තිබෙන විනාශයන් පිළබඳව ඔවුන්ට දඬුවම් හිමි විය යුතු ය. එහෙත් මේ අය ආණ්ඩු බලය ගත්තේ ඒ සඳහා පමණක් නොවන අතර පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ගොඩ නැගිමට ය. ඒ සඳහා ගෙවි ගිය වසර දෙක තුල ආණ්ඩුව දුර දිග යන බරපතල ප්‍රතිසංස්කරණ කිසිවක් ආරම්භ කිරීමටවත් 'සූදානම් බවක් පෙනෙන්ට නැත. ජනතාවගෙන් සියයට 65 ක් දරිද්‍රතාවයෙන් පසුවන අතර තරුණ උගතුන්ගේ විරැකියාව සියයට 43 කී. ඒ අතර උද්ධනමනය සියයට 8 දක්වා ඉහල ගොස් ඇති බව නවතම සංඛ්‍යා ලේඛණ පෙන්නුම් කර ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නිකුත් කරන ලද නවතම වාර්තාවට අනුව අවුරුදු 15 ක් 24 ක් අතර වයස් කාණ්ඩයේ උගත් තරුණයින්ගේ සියයට 43 ක් රැකියා විරහිතව සිටී. එය දකුණු ආසියාතික කලාපයේ වයස් කාණ්ඩයේ සිටින උගතුන් අතර ඉහලම රැකියා විරහිත අනුපාතය බව වාර්තාවේ. සාමාන්‍ය ඩිප්ලොමාවක් හිමි තරුණ තරුණියකුට තමන්ට හිමි සුදුසුකම්වලට අනුව රැකියාවක් සොයා ගැනිමට නොහැකිවීම සුළු කාරණයක් නොවේ. රටේ තරුන ජනතාව මුහුණ දෙන අභියෝගයේ ගැඹුර ඉතා බරපතල වුව ද ආණ්ඩුවේ නායකයින් වේදිකාවල විපක්ෂයට විශේෂයෙන් රාජපක්ෂ පවුල හම ගසමින් ස්වයං වින්දනයක් ලබනවා හැර ජනතාව මුහුණ දෙන සැබෑ ප්‍රශ්නවලට විසඳුම් ඉදිරිපත් කිරීමට අසමත්ව සිටී.

එසේ වුව ද මෙම ආණ්ඩුවේ සැබෑ වුවමණාව ප්‍රසිද්ධියට පත්වූයේ 22 වන ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීමට දක්වන ලද අතිශය කුමන්ත්‍රනකාරි කලබලකාරි හදිසියයි. මැතිවරණ ප්‍රකාශණයේ අවධාරණය කර තිබෙන අලුත් ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම ගැන කිසිදු පියවරක් නොගෙන ඔවුන් මැතිවරණ කාලයේ වේදිකාවල උපහාසයෙන් සඳහන් කළ ව්‍යවස්ථාවට අණ්ඩ දැමීමට කටයුතු කරණ ලද්දේ ඊට අදාල ක්ෂෙත්‍රවල කිසිදු සාකච්ඡාවකින් තොරව කටයුතු කරනු ලැබීම අතිශය ප්‍රශ්නකාරි වේ. නඩු කටයුතු ඉක්මන් කිරීම සඳහා විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීම යන්න කිතුල් ගසට නැග්ග මිනිසා කියන ලද කතාවට වඩා වැඩි දෙයක් නොවේ. ආණ්ඩුවේ අප්‍රකාශිත උවමණාව වන්නේ ඔවුන් ඒකාධිපති පාලනයක් කරා යන ගමන වෙනුවෙන් අවශ්‍ය අන්දමට අධිකරණය හීලෑ කර ගැනිමට තිබෙන උවමණාව බව ඉදිරි කාලයේ සිදුවීම් දිග හැරීම හරහා විද්‍යාමාන වනු ඇත. අල්ලස් කොමිෂමේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට අධිකරණ බලය දීමට ආණ්ඩුව විසින් දරණ ලද උත්සහාය අධිකරණ නියෝගයක් නිසා තාවකාලික අත්හිටුවීමට සිදුවීම ද මෙහිලා සඳහන් කළ යුතු ය. ඔවුන් තුළ පවතින උවමණාවන් ධනේෂ්වර ආයතනයක් වන එක්සත් ජාතින්ගේ සංවිධානයේ ප්‍රධානියා විසින් නොබෝදා සිදු කළ ප්‍රකාශයකින් නැවත තහවුරු වනු ඇත.

*''නීතිමය හා ආයතනික ප්‍රතිසංස්කරණ සිදුකරන බවට පොරොන්දුවී තිබිය දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිතා කිරීම රජය විසින් දිගින් දිගටම සිදු කෙරෙමින් පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස අන්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම හා චෝදනා ගොනු කිරීමකින් තොරව දීර්ඝ කාලයක් රඳවා ගැනීම් සිදු වෙමින් පවතී. විධායක බලය අවභාවිතාව ඇතුලු මානව හිමිකම් කඩ කිරීම් අවසන් කිරීමට පියවර ගන්නා ලෙස අපි ඉල්ලා සිටිනවා''*

රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව මැතිවරණවලට මුහුණ දීමට අපොහොසත්කම නිසා විවිධ හේතු පෙන්වා පළාත් පාලන ඡන්ද කල් දැමීමට කටයුතු කර අන්දමට මේ ආණ්ඩුව ද පළාත් සභා ඡන්දය නොපැවත්වීමට ඊනියා තේරීම් කාරක සභා ප්‍රෝඩාව ඉදිරියට දමා ඇත. ඇත්ත තත්ත්වටය නම් මේ ආණ්ඩුව බලයට පත්වී මාස 6ක් ගත වූ විට පවත්වනු ලැබු පළාත් පාලන ඡන්දයෙන් ලක්ෂ 23 ක ඡන්දයක් ජාතික ජන බලවේගයට අහිමිවීම නිසා එවැනි ඡන්දයකට මුහුණ දීමට ආණ්ඩුව සූදානම් නැති බවය. ආණ්ඩුව බලයට පත් වූ මුල් දිනවල හජජ නායකයින් ප්‍රකාශ කළේ ඔවුන්ගේ මන්ත්‍රීවරු 159 දෙනාම කදිරගාමර් පන්නයේ උගතුන් බව ය. එසේ වුව ද මේ වන විට ඔවුන්ගේ සීමාවන් කුමක් ද යන්න රට ඉදිරියේ හෙළිදරව් වී අවසානය විදේශ කටයුතු ඇමති විජිත හේරත් කදිරගාමර් නොවනවා පමණක් නොව වසන්ත සමරසිංහ ඇතුලත් මුදලි නොවනවා සේම ලාල් කාන්ත ගාමිණී දිසානායක නොවන බවත් හරිනි අමරසූරිය සිරිමා බණ්ඩාරනායක වැනි ධනපති නායකයින් නොවන බවත් ජනතාව තේරුම් ගෙන අවසාන ය.

කවුරු කෙසේ කීවත් මාලිමා ආණ්ඩුව අඩු වැඩි වශයෙන් මේ රට පාලනය කළ අනෙකුත් ධනපති පක්ෂවල පාලනය මෙන්ම මේ ආණ්ඩුවේ පාලනය ද දූෂිත එකකී. කන්ටේනර් 323 සිදුවීම හා කුප්‍රකට ගල් අගුරු වංචාව මහ භාණ්ඩාගාරයේ ඩොලර් මිලියන් 2.5 සොරකම හා සහල් ආනයනයේ දී සිදුවූ ටෙන්ඩර් මගඩිය වැනි සිදුවීම් ගනනාවක්ම ඇත. ඒවා ආණ්ඩු බලය පාවිච්චි කර යට ගසා ගෙන සිටින බව තේරුම් ගැනීමට අපහසු නොවේ ජාතික ජන බලවේග ආණ්ඩුවේ ප්‍රධාන නායකයින් මේ දිනවල නිතර ප්‍රකාශ කරන්නේ ඔවුන්ට ආණ්ඩු බලය ලැබුණ ද රාජ්‍ය බලය නොමැති බවත් ඒ නිසා රාජ්‍ය බලය අත්පත් කර ගැනීමට පියවර ගනිමින් සිටින බවත් ය. ආණ්ඩුවට විධායක බලය හා අධිකරන බලය ඇතුළු සමස්ත රාජ්‍ය බලය තිබුණ ද ඉදිරියේ මතුවන ආර්ථික අර්බුදයට විසඳුම් දීමට අපොහොසත් වන්නේ නම් දේශපාලන බලය නැගී එන ජනතා බලය මගින් අභියෝගයට ලක්වන බව අපි අවධාරණය කර සිටිමු.

බංකොලොත් විපක්ෂයට ස්වාධීන විකල්ප සමාජ ආර්ථික වැඩපිළිවෙලක් නොමැති පසුබිමක ඔවුන් තම වැවැත්ම සඳහා මාලිමා ආණ්ඩුවට එරෙහිව සිල්ලර විවේචනයන් ඉදිරිපත් කර බංකොලොත්කම වසා ගැනීමේ වසා විහිලු උත්සහායක යෙදී සිටින බව පෙනේ. එහෙත් අපගේ විවේචනය වෙන්නේ මේ ආණ්ඩුව විසින් පවත්වා ගෙන යන නව ලිබරල් ආර්ථික වැඩ පිළිවෙලට එරෙහි වූවකී. අනුර කුමාරගේ ආණ්ඩුව මෙතෙක් කල් රට පාලනය කළ විනාශකාරි ධනවාදි වැඩ පිළිවෙල කිසිදු හිරිකිතයකින් තොරව පවත්වා ගෙන යයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) අතුළු චීනය හා ඉන්දියාව වැනි රටවලට ගෙවිය යුතු ණය අහෝසිකර ස්වාධීන නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නැගීම සඳහා වැඩ පිළිවෙලක් ඉදිරිපත් කර තිබෙන්නේ එක්සත් සමාජවාදි පක්ෂය පමණී.

අවසන් වශයෙන් ජාතික ජන බලවේගය ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය ජය ග්‍රහණය කළ හැකි වූයේ ඔවුන් දුන් පොරොන්දුවලට ජනතාව රැවටීමට වඩා විශේෂයෙන් රාජපක්ෂලාගේ දූෂිත පාලනයට එරෙහිව රට පුරා ගොඩ නැගෙමින් තිබු අති විශාල විරෝධය බව තේරුම් ගත යුතු ය. මෙම සාධකය නාගරික මැද පංතිය තුළ ගැඹුරින් කාවැදි තිබූ අතර ඊට සාපේක්ෂව ජාතික ජන බලවේගය පිරිසිදු හා අවංක දේශපාලන කංඩායමක්ය යන්න සමාජය තුළ තහවුරු වෙමින් පැවැති අතර මතුපිට කරුණු අතපත ගා තීන්දු ගැනීම ලාංකීය සමාජය දක්වන ගැඹුරු ඌනතාවය ගෝඨාභයගේ සිට මේ දක්වා පැවැති සියලු මැතිවරණවලින් පෙන්නුම් කෙරින. මෙහිදි සමාජයේ උගතුන් වැනි ජන කොට්ඨාශ විශේෂයෙන් අන්ධානුකරණයෙන් තීන්දුවලට එළැඹී බව දක්නට හැකිය. මෙම තත්ත්වය නැවත ඇති වීමට ඉඩ නොදීම සැබෑ වාමාංශිකයින්ගේ වගකීම වන්නේ ය. ඊට අවශ්‍ය ලෙස මහ වැඩ වර්ජනයක් මැදි කරගත් ජන අරගලය කේන්ද්‍ර කර ගත් වමේ වැඩ පිළිවෙලක් වෙනුවෙන් සටන් වැදීම අපගේ කාර්ය භාරය වනු ඇත.

**තාරක**

# ශිෂ්‍ය ප්‍රජාවට හිමි

රටේ ආර්ථිකය "යථා තත්ත්වයට පත්වෙමින්" ඇතැයි සංඛ්‍යා කියයි. එහෙත් දේශනය අවසන් කර බස් නැවතුමට දිව යන විශ්වවිද්‍යාල ශිෂ්‍යයාගේ සාක්කුවේ එම ප්‍රකෘතිමත්වීම තවමත් පෙනෙන්නේ නැත. ලෝක බැංකු සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිව්‍යුහගතකරණ කොන්දේසි යටතේ ක්‍රියාත්මක වූ ආර්ථික ප්‍රතිපත්ති නිසා, දෙමාපියන්ට තම දරුවන්ගේ විශ්වවිද්‍යාල වියදම් දැරීමට නොහැකි වී තිබේ. රුපියල් දස දහසකට අඩු මහපොළ හෝ බර්සරි දීමනාවකින් කොළඹ, පේරාදෙණිය, ජයවර්ධනපුර, කැලණිය හෝ රුහුණ වැනි ප්‍රධාන විශ්වවිද්‍යාල නගරවල නවාතැන් ගාස්තු, ප්‍රවාහනය, ආහාර පාන මිලදී ගැනීම සම්පූර්ණයෙන්ම අසීරුය. අද වන විට කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල නවාතැන්පළක හෝ කුලී කාමරයක කුලිය මසකට රුපියල් විසිපස් දහස සිට තිස් දහස දක්වා ඉහළ ගොස් ඇත. ගමන් වියදම්, ආහාර, දුරකථන බිල්, පොත්පත් හා පාඨමාලා ගාස්තු අතර ජීවිතය පවත්වාගෙන යාම සඳහා ඔහුට හෝ ඇයට දවසේ තවත් පැය කිහිපයක් විකිණීමට සිදුවෙයි. මෙය තනි පුද්ගලයකුගේ "වෙහෙස මහන්සි වී ඉදිරියට යාමේ" කතාවක් නොව, අර්බුදයකින් පසු ශ්‍රමය හා ජීවිතය නැවත සංවිධානය වන ආකාරය පිළිබඳ සමාජ ප්‍රශ්නයකි.

# අධ්‍යාපනය ද ? නැතිනම් දවසේ වැටුපද ?

## ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාවගේ අර්ධකාලීන රැකියා අරගලය



2022 ආර්ථික කඩාවැටීමෙන් පසු ශ්‍රී ලංකාවේ ආදායම්, රැකියා සහ මිලදී ගැනීමේ හැකියාව දැඩි ලෙස පීඩනයට ලක්විය. ලෝක බැංකුව පෙන්වා දෙන්නේ 2021-2023 අතර ආර්ථික නිෂ්පාදනය සමුච්චිතව 9.5%කින් හැකිළුණු බවත්, 2024 දී දරිද්‍රතා අනුපාතය 24.5%ක් පමණ වූ බවත්ය. 2026 අගෝස්තුවේ ජාතික උද්ධමනය 8.1%ක් විය. 2021-2026 අතර ආහාර මිල දෙගුණයකට වඩා ඉහළ ගොස් ඇති අතර සැබෑ වැටුප් 2019 මට්ටමට වඩා පහළින් පවතී. එබැවින් ඉලක්කම් පෙන්වීම පමණක් ජීවන අරගලය අවසන් වූ බවට සාක්ෂියක් නොවේ.

රැකියා වෙළෙඳපොළේ පීඩනය තරුණයන්ට තවත් තදින් දැනේ. 2026 සිව්වන කාර්තුවේ සමස්ත රැකියා වියුක්තිය 4.0%ක් වූ අතර, වයස 15-24 තරුණ තරුණියන්ගේ රැකියා වියුක්තිය 18.7%කි. එමෙන්ම IMF නවතම වාර්තා අනුව ආසියාවේ උසස් අධ්‍යාපනයක් හෝ තෘතීයික අධ්‍යාපනයක් සහිත තරුණ තරුණියන් (වයස අවුරුදු 15-24) අතර ඉහළම රැකියා විරහිතභාවයක් ඇති රට බවට ශ්‍රී ලංකාව පත් වී ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ උගත් තරුණ ප්‍රජාවගෙන 43% ක ට විරැකියාව බලපා තිබේ.

මෙවැනි වෙළෙඳපොළක උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයා ඇතුළු තරුණ ප්‍රජාවගේ "අර්ධකාලීන රැකියාව" තෝරාග ැනීමක් නොව, පැවැත්මේ අනිවාර්යතාවක් වී තිබේ. 2024 දී ප්‍රකාශිත ශ්‍රී ලාංකික රාජ්‍ය විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් 122 දෙනෙකු ඇතුළත් අධ්‍යයනයක් ජීවන වියදම්, අධ්‍යාපනික ද්‍රව්‍ය මිල සහ මූල්‍ය පීඩනය ශිෂ්‍ය ජීවිතයට බලපාන බව සටහන් කළේය. එම නියැදියේ 45.08%කට මාසික ආදායම රු.5,000-20,000 අතර වූ අතර 13.93%කට කිසිදු ආදායමක් නොතිබුණි.

මේ අනුව අධ්‍යාපනය සහ වැඩ කිරීම යන ද්විත්ව ජීවිතය බිහිවෙයි. වැඩ කරන ශිෂ්‍යයාට අධ්‍යාපනය සඳහා තිබිය යුතු කාලය අඩුවෙයි. සමාජ සබඳතා, ක්‍රීඩා, නින්ද සහ විවේකය මෙන්ම සංස්කෘතික ජීවිතය පසුපසට යයි. අර්ධකාලීන රැකියාව අධ්‍යාපනයට අමතර දෙයක් නොව, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තීරණය කරන සාධකයක් බවට පත්වෙයි. තවද පෞද්ගලික උසස් අධ්‍යාපනයේ ගාස්තු ගෙවන ශිෂ්‍යයාට මෙය ණය හා පවුල් වියදම් සමඟ තවත් දැඩි පීඩනයක් බවට පත්විය හැක.

මෙම තත්ත්වය තුළ බිහි වී ඇති අර්ධකාලීන ශ්‍රම වෙළෙඳපොළ යනු අතිශය ම්ලේච්ඡ ධනපති සූරාකෑමේ තෝතැන්නකි. මෙහි ප්‍රධාන ගැටලුව වන්නේ අර්ධ කාලීන කම්කරුවාට ලැබෙන ආරක්ෂාවයි. ශ්‍රී ලංකාවේ අවිධිමත් රැකියාව යනු නීතියෙන් පිටත වැඩ කිරීම පමණක් නොවේ. ස්ථිර සේවා සම්බන්ධතාවක් නොමැති වීම, EPF/ETF නොලැබීම, ලිඛිත ගිවිසුම් නොමැති වීම, කම්කරු අයිතිවාසිකම් නොසලකා හැරීම, සේවා අනාරක්ෂිතතාවය වැනි අවදානම්ද එයට ඇතුළත් වේ. DCS දත්ත අනුව 2024 දී රැකියා වෙළෙඳපොළ තුළ 57.5%ක් අවිධිමත් රැකියා ලෙස වර්ගීකරණය විය. ILO අනුව ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් 67%කට වැඩි පිරිසක් අවිධිමත් රැකියාවල සිටින අතර, අවම වශයෙන් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභවලින් ආවරණය වන්නේ ජනගහනයෙන් 41.3%ක් පමණි.

ඒ නිසා "දවසකට වැඩ කර මුදල් ගන්නවා" යන්න නිදහසක් මෙන් පෙනුණද, එහි අනෙක් පැත්ත අස්ථිරභාවයයි. අද වැඩ තිබුණත් හෙට නොතිබිය හැක; වැඩ කළ පැය ගණන හා ගෙවන මුදල අතර පැහැදිලි සම්බන්ධයක් නැති විය හැක; අනතුරක් සිදුවුවහොත් ආදායම නවතී. විශේෂයෙන් ආහාර බෙදාහැරීම, ප්‍රවාහනය, උත්සව සංවිධානය හා වෙළඳ ප්‍රවර්ධන - ප්‍රචාරණ කටයුතු වැනි ක්ෂේත්‍රවල ඉල්ලුම අනුව ශ්‍රමය කැඳවීම සේවායෝජකයාගේ වියදම අඩු කරන අතර අවදානම කම්කරුවා වෙත තල්ලු කරයි. ශ්‍රී ලංකා gig-කම්කරුවන් පිළිබඳ පර්යේෂණවලද ආදායම් අස්ථිරභාවය, වෘත්තීය අවදානම, සමාජ ආරක්ෂණ හිඟය සහ ඇල්ගොරිතම මගින් පාලනය කිරීම පිළිබඳ ගැටලු හඳුනාගෙන ඇත.

මෙහිදී ස්ත්‍රී පුරුෂ අසමානතාවද නොසලකා හැරිය නොහැක. 2026 සිව්වන කාර්තුවේ සමස්ත තරුණ විරැකියාව 18.7%ක් වූ නමුත් තරුණ කාන්තාවන්ගේ විරැකියා ප්‍රතිශතය පුරුෂ පක්ෂයට සාපේක්ෂව වැඩි ප්‍රමාණයක් වේ. එමෙන් ම උගත් තරුණ කාන්තාවන්ගේ රැකියා වියුක්ති අනුපාතය 9.6% ක අගයක් ගනී. රැකියාවකට යාමට ප්‍රවාහන වියදම්, රාත්‍රී මුරවල ආරක්ෂාව, පවුලේ රැකවරණ වගකීම් සහ සේවා ස්ථානයේ ලිංගික හිරිහැර පිළිබඳ බිය නිසා කාන්තා ශිෂ්‍යයන්ගේ තේරීම් තවත් සීමා වී තිබේ. තව ද සමරිසි ප්‍රජාවගේ තත්ත්වය ඊටත් අන්ත අසරණ ස්වභාවයක් ගනී. එබැවින් "ඕනෑ නම් වැඩක් සොයාගන්න" යන වෙළෙඳපොළ තර්කය සමාජයේ සියලු තරුණයන්ට සමානව අදාළ නොවේ.

අනෙක් අතට, අර්ධකාලීන සේවකයාගේ දුර්වල කේවල් කිරීමේ බලය සේවායෝජකයාට වාසියකි. "ශිෂ්‍යයෙක් නිසා අත්දැකීමක් ලබාගන්න" යන නාමයෙන් නොගෙවන පුහුණු කාල, අමතර පැය, කැෂ් ගෙවීම්, ලිඛිත ගිවිසුම් නොමැතිකම හෝ අවසන් මොහොතේ shift වෙනස් කිරීම සාමාන්‍යකරණය වුවහොත්, අධ්‍යාපනය ලබන තරුණයා ලාභදායී සහ පහසුවෙන් ප්‍රතිස්ථාපනය කළ හැකි ශ්‍රම සංචිතයක් බවට පත්වෙයි. එය නව තාක්ෂණය නිසා ඇති වූ ප්‍රශ්නයක් පමණක් නොව, පරණ ශ්‍රම සූරාකෑම ඩිජිටල් වේදිකාවකට මාරුවීමකි.

නව තාක්ෂණ ධනවාදය මෙයට නව මුහුණුවරක් දී තිබේ. WhatsApp/Telegram සහ වෙනත් සමාජ මාධ්‍ය කණ්ඩායම් හරහා "අද වැඩ", "අද ගෙවීම්", "එක් දින සේවකයන් අවශ්‍යයි" වැනි අවස්ථා ඉක්මනින් දහස් ගණනකට බෙදා හැරිය හැක. මෙය අවස්ථාවක්ද, නව ශ්‍රම වෙළෙඳපොළක්ද, නැතිනම් සූරාකෑමේ නව යාන්ත්‍රණයක්ද යන්න විමසිය යුතුය. ඩිජිටල් වේදිකා හරහා සිදුවන මෙම ශ්‍රම සූරාකෑම නියාමනය කිරීමට කිසිදු යාන්ත්‍රණයක් නොමැති වීම නිසා තරුණ ශ්‍රමිකයෝ නූතන ඩිජිටල් වහලුන් බවට පත්ව සිටිති. කණ්ඩායම් පරිපාලකයා සහ කම්කරුවා අතර අතරමැදියකු සිටී නම් විශාල වශයෙන් කොමිස් මුදල් කපාගැනීම, අවසන් මොහොතේ වැඩ අවලංගු කිරීම, පොරොන්දු වූ මුදල නොගෙවීම, පෞද්ගලික තොරතුරු ලබාගැනීම වැනි අවදානම් මතුවීම සාමාන්‍යකරණය වී තිබේ. මෙම අර්බුදය හමුවේ රාජ්‍ය මැදිහත් වීමේ පවතින අන්ත දුර්වලතාව සහ නිද්‍රාශීලී ප්‍රතිපත්තිය තත්ත්වය වඩාත් බරපතළ කර ඇත.

මෙය හුදු අනුමානයක් නොවේ. ශ්‍රී ලංකා පොලිසිය සමාජ මාධ්‍ය හරහා ව්‍යාජ රැකියා අවස්ථා ලබාදී මුදල්, බැංකු තොරතුරු, OTP සහ QR කේත ලබාගැනීම පිළිබඳ මහජන අනතුරු ඇඟවීම් නිකුත් කර ඇත. මූල්‍ය බුද්ධි ඒකකය "task scams" ලෙස හඳුන්වන වංචාවලදී ව්‍යාජ සේවායෝජකයන් සරල කාර්යයන් ලබාදී පසුව ලියාපදිංචි ගාස්තු හෝ මුදල් ඉල්ලා ගන්නා බවද වාර්තා කරයි. එබැවින් WhatsApp රැකියා කණ්ඩායම් සියල්ල වංචාකාරී යැයි නොකියන නමුත්, නියාමනය නොකළ ඩිජිටල් අතරමැදියන් නව අවදානම් කලාපයක් නිර්මාණය කරන බව පැහැදිලිය.

ඒ නිසා ප්‍රතිචාරයත් බහුමාන විය යුතුය. විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවලට ශිෂ්‍ය රැකියා සහන මධ්‍යස්ථාන, නීත්‍යානුකූල සේවායෝජක ලියාපදිංචි පද්ධති සහ පැමිණිලි යාන්ත්‍රණ අවශ්‍යය. කම්කරු දෙපාර්තමේන්තුවට අර්ධකාලීන හා platform වැඩ පිළිබඳ ඉලක්කගත පරීක්ෂණ අවශ්‍යය. රජයට ශිෂ්‍ය ප්‍රවාහන, ආහාර සහ නවාතැන් සහන ශක්තිමත් කිරීමටත්, අධ්‍යාපනයේ වියදම පවුල මත පමණක් නොතැබීමටත් සිදුවේ. එසේ නොමැතිනම් "රැකියා නිර්මාණය" යන සංඛ්‍යාව වැඩි කළත්, නිර්මාණය වන්නේ ගෞරවනීය රැකියාද නැතිනම් දිනෙන් දින කැඳවන අස්ථිර ශ්‍රමයද යන්න අපට අමතක වේ.

රජයේ වගකීම මෙහිදී වැටුප් වැඩි කිරීමෙන් පමණක් අවසන් නොවේ. 2026 ජනවාරි සිට ජාතික අවම මාසික වැටුප රු.30,000ක් සහ දෛනික අවම වැටුප රු.1,200ක් ලෙස නියම කර ඇත. තවද EPF සහ ETF නීති අනුව තාවකාලික, casual, contract සහ shift සේවකයන් පවා ආවරණයට අයත් වේ. නමුත් නීතිය තිබීම සහ එය ක්‍රියාත්මක වීම එකම දෙයක් නොවේ. විශේෂයෙන් ඩිජිටල් වේදිකා ශ්‍රමය සඳහා නීතිමය හිස්තැන් තවමත් වැදගත්ය. 2026 ජූනි මාසයේ ILO විසින් Platform Economy පිළිබඳ Convention No.193 සම්මත කරමින් නිසි රැකියා තත්ත්වය, ගෙවීම්, සමාජ ආරක්ෂණය, ආරක්ෂිත සේවා පරිසරය සහ ඇල්ගොරිතමික පාලනය සම්බන්ධ වගකීම් අවධාරණය කළේය. එය තවමත් රටවල් විසින් අනුමත කළ යුතු ජාත්‍යන්තර ප්‍රමිතියකි; ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීම සඳහා නීති, පරීක්ෂණ හා සාමූහික කේවල් කිරීම ශක්තිමත් කළ යුතුය.

අවසානයේ ගැටලුව වැටුපකට වඩා විශාලය. 2023දී ජැෆ්නා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් 637ක් යොදා කළ අධ්‍යයනයක 31%කට major depressive disorder සඳහා අවදානම් තත්ත්වයක් හඳුනාගත් අතර 70%ක් යම් මට්ටමක මානසික අවපීඩන ලක්ෂණ අත්විඳි බව වාර්තා විය. එම පර්යේෂණය අධ්‍යාපන පීඩනය, මූල්‍ය දුෂ්කරතා සහ රැකියා අනාගතය පිළිබඳ අනාරක්ෂිතභාවයද සාකච්ඡා කරයි. දවාලට දේශනවලට සහභාගී වී, රාත්‍රියේ සහ සති අන්තයේ අර්ධකාලීන රැකියා කරන සිසුන්ගේ මොළයට සහ සිරුරට ලැබෙන විවේකය සම්පූර්ණයෙන්ම අහිමි වී ඇත. මෙය ඔවුන්ගේ ශාස්ත්‍රීය කාර්ය සාධනය මෙන්ම අනාගත බලාපොරොත්තු ද බිඳ දමයි. අධ්‍යාපනය යනු නිදහසක් නොව, ණය උගුලක සහ කුසගින්නේ හිරවීමක් බවට පත්ව තිබීමෙන් තරුණ මනසට එල්ල වන පහර අතිමහත්ය. පර්යේෂණවලට අනුව, ආර්ථික පීඩනය නිසා සිසුන් අතර ආත්ම විශ්වාසය හීන වීම, අධ්‍යාපනය අතහැර දැමීමේ ප්‍රවණතාව ඉහළ යෑම සහ අනාගතය පිළිබඳ බලාපොරොත්තු සුන් වීම ඉහළ ගොස් තිබේ.

තරුණයාගේ පැය විකිණීමෙන් ආර්ථිකය ගොඩනැගෙන්නේ නම්,කළ යුත්තේ ඔහු තවත් පැය විකිණීමට දිරිගැන්වීම නොව, ඔහුගේ ශ්‍රමයට වටිනාකමක්, ආරක්ෂාවක් සහ අනාගතයක් ගොඩනැගීමයි. මේ මොහොතේ අවශ්‍ය වන්නේ "ශිෂ්‍යයා වැඩ කරන්නේ නම් ඔහු ශක්තිමත්ය" යන රොමෑන්තික කතාව නොවේ. ශිෂ්‍යයාට ඉගෙනීමට කාලය, ජීවත්වීමට ප්‍රමාණවත් ආදායම, වැඩ කිරීමට ආරක්ෂාව සහ අනාගතයක් පිළිබඳ විශ්වාසය ලබාදෙන සමාජයකි. අර්ධකාලීන රැකියාව තෝරාගැනීමේ නිදහස තිබිය යුතුය; ජීවත්වීම සඳහා එය අනිවාර්ය වන සමාජයක් නොවිය යුතුය. එබැවින් අප ශිෂ්‍යයන් ඇතුළු තරුණ ප්‍රජාවන්ට යෝජනා කරනුයේ තාවකාලික සහන දීමනාවලින් සහ ආධාරවලින් එපිටට ගිය, සැබෑ පන්තිමය විමුක්තිය සහ සමාජ ක්‍රමයේ මූලික වෙනසක් සඳහා සමාජවාදී වැඩපිළිවෙලක් වෙනුවෙන් සටන් වැදීම සඳහා පෙරමුණ ගන්නා ලෙසයි.

**සාලිය කණුගල.**

# ලංකවේ තේ (Ceylon Tea) වල ශෝචනීය ඛේදවාචකයේ ඉතිහාසය

01 - කොටස

ආගන්තුකයාගේ කොළම

වජිර පූජිත ගුණවර්ධණ

තේ (Camellia sinensis) වගාවේ ආරම්භය චීනයේ සිදු වූ බවට සාක්ෂි ඇත. පුරාවෘත්ත අනුව ක්‍රි.පූ. 2737 දී චීන අධිරාජ්‍යයෙකු වූ ෂෙන් නොංගේ උණු වතුරට තේ කොළ වැටීමෙන් තේ පානය සොයාගත් බව කියැවේ. ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය ආරම්භ වූයේ කෝපි වගාව බිඳවැටීමෙන් පසුවය. ඒ 1860 දශකයේදී කෝපි වගාවට බලපෑ කෝපි මලකඩ රෝගය (කෝපි මලකඩ රෝගය යනු Hemileia Vastatrix නම් දිලීරය නිසා වැළඳෙන ඉතා විනාශකාරී සහ භයානක රෝග යකි) හේතුවෙන් විනාශ විය.

ජේම්ස් ටේලර් නම් සුදු ජාතික වතු පාලකයා විසින් 1867 දී මහනුවර දිස්ත්‍රික්කයේ ලූල්කඳුර වත්තේ වාණිජ තේ වගාව හා තේ නිපදවීම ආරම්භ කිරීමත් සමඟ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයට ශක්තිමත් පදනමක් ඇති විය. පසුව බ්‍රිතාන්‍ය වැවිලිකරුවන් විසින් තේ වගාව නුවරඑළිය, ඌව, සහ රුහුණු ප්‍රදේශ ඇතුළු කඳුකර ප්‍රදේශවලට ව්‍යාප්ත කරන ලදී.

අද ශ්‍රී ලංකාව "Ceylon Tea" නමින් ලෝක ප්‍රසිද්ධ උසස් තත්ත්වයේ තේ නිෂ්පාදකයෙකි. ශ්‍රී ලංකාවේ ආර්ථිකයට, අපනයන වෙළඳාමට සහ වැවිලි ප්‍රජාවගේ ජීවනෝපායට තේ කර්මාන්තය විශාල දායකත්වයක් සපයයි. 1880 දශකය වන විට Ceylon Tea රටේ ප්‍රධාන අපනයන භාණ්ඩය බවට පත්විය. 1883 දී කොළඹ පළමු තේ වෙන්දේසිය පැවැත්වුණු අතර, 1890 දශකය අවසන් වන විට තේ කෝපි අභිබවා අපනයන ප්‍රමාණය, ආදායම සහ වගා භූමි ප්‍රමාණය අතින් ප්‍රමුඛ වගාව බවට පත්විය. 1962 වන විට අප රට ලෝකයේ විශාලතම තේ අපනයනකරුවා බවට පත්ව තිබුණි. 1965 දී පළමු වරට ලෝකයේ අංක එකේ තේ අපනයන රට බවට නිල වශයෙන් සඳහන් වේ. එවකට "Ceylon Tea" යන නාමය ලෝක වෙළඳපොළේ ඉතා ශක්තිමත් වෙළඳ නාමයක් විය. 70 දශකය ආරම්භයේ දී තේ ශ්‍රී ලංකාවේ මුළු අපනයන ආදායමෙන් ඉතා විශාල පංගුවක් අත්කරගෙන තිබුනි. මෙම කාලයේදී ශ්‍රී ලංකාව ලෝකයේ ප්‍රධාන තේ අපනයනකරුවන් අතර දිගටම රැඳී සිටියද, කෙන්යාව වැනි රටවල් වේගවත් වර්ධනය නිසා ශ්‍රී ලංකාවේ පළමු ස්ථානයට තරඟය වැඩි විය. 2004 දී කෙන්යාව ශ්‍රී ලංකාව අභිබවා ලෝකයේ විශාලතම තේ අපනයනකරුවා බවට පත්විය. 2005 දී ශ්‍රී ලංකාවට ලෝක තේ අපනයන වෙළඳපොළෙන් 19.2%ක පමණ කොටසක් තිබූ අතර ලෝකයේ දෙවන විශාලතම තේ අපනයනකරුවා විය. නමුත් 2010-2020 චීනය ද මෙම තරගයට එක්වීම නිසාම ශ්‍රී ලංකාව තෙවන විශාලතම තේ අපනයනකරුවා බවට පත්විය.



චීනය සහ කෙන්යාව ලෝක තේ අපනයනයේ ඉහළම ස්ථානවලට පැමිණීමට හේතු එකිනෙකට වෙනස් වේ. චීනයේ ශක්තිය විශාල නිෂ්පාදනය, විවිධ තේ වර්ග සහ විශාල දේශීය කර්මාන්තය මත පදනම් වන අතර, කෙන්යාවේ ශක්තිය ප්‍රධාන වශයෙන් විශාල පරිමාණයේ කළු තේ නිෂ්පාදනය, කුඩා ගොවීන්ගේ සංවිධානාත්මක ක්‍රමය සහ කාර්යක්ෂම අපනයන පද්ධතිය මත පදනම් වේ.

චීනයේ තේ භාවිතය වසර දහස් ගණනක් පැරණි අතර, තේ එරට ආහාර හා සංස්කෘතියේ කොටසක් වී තිබේ. එම නිසා තේ වගාව, සැකසීම සහ වෙළඳාම පිළිබඳ විශාල දැනුමක් හා අත්දැකීමක් ඔවුන් සතුව ඇත. චීනය අදත් ලෝකයේ විශාලතම තේ නිෂ්පාදකයා වේ. 2025 දී ලෝක තේ නිෂ්පාදනය ටොන් මිලියන 7.3ක් පමණ වූ අතර, ඉන් චීනයේ නිෂ්පාදනය ඉතා විශාල කොටසක් විය.මෙය අපනයනය සඳහා විශාල සැපයුමක් ලබාදීමට උපකාරී වේ. එසේම ශ්‍රී ලංකාව සහ කෙන්යාව ප්‍රධාන වශයෙන් කළු තේ සඳහා ප්‍රසිද්ධ වුවත් චීනය Green Tea (හරිත තේ), Black tea (කළු තේ), Oolong Tea (හරිත සහ කළු තේ අතර රසය, වර්ණය සහ සැකසීම් වලින් වෙනස් වූවක් වේ.), White Tea (සුදු තේ) Dark/Pu-erh Tea (චීනයේ යුනාන් පළාතෙන් ආරම්භ වූ පසු පැසුණු අඳුරු තේ වර්ගයකි.)

වැනි විවිධ තේ වර්ග නිෂ්පාදනය කරයි. විශේෂයෙන් green tea ලෝක වෙළඳපොළේ චීනයට විශාල ශක්තියකි. 2010 දශකයේදී ලෝක green-tea වෙළඳාම චීනය විසින් දැඩි ලෙස ආධිපත්‍යය දැරීය. එසේම චීනයේ ජනගහනය විශාල බැවින් නිෂ්පාදනය කරන තේවල විශාල ප්‍රමාණයක් රට තුළම පරිභෝජනය වේ. එමඟින් නිෂ්පාදකයන්ට විශාල දේශීය වෙළඳපොළක් ලැබෙන අතර, ඒ සමඟම අපනයන වෙළඳපොළත් පවත්වාගෙන යා හැකිය.



චීනය සාම්ප්‍රදායික තේ නිෂ්පාදනයට අමතරව නවීන සැකසුම්, ඇසුරුම්කරණ සහ විවිධ රස/ගුණාංග සහිත තේ නිෂ්පාදන වෙත යොමු වී ඇත. චීනයේ green-tea නිෂ්පාදනය අනාගතයේදීත් ඉහළ යාමට ප්‍රධාන හේතුවක් වන්නේ එහි නිෂ්පාදන හැකියාව හා වෙළඳපොළ ඉල්ලුමයි.

කෙන්යාවේ කතාව තරමක් වෙනස්ය. කෙන්යාව ලෝකයේ විශාලතම කළු තේ අපනයනකරුවන් අතර ප්‍රමුඛයා බවට පත්වී ඇත්තේ විශේෂයෙන් අපනයන නැඹුරු (export-oriented) කර්මාන්තයක් ලෙස වර්ධනය වීම නිසාය. 2018 දී කෙන්යාව ලෝකයේ විශාලතම සම්ප්‍රදායික කළු තේ අපනයන කරුවා (black-tea exporter) බවට පත්විය. එමෙන්ම කෙන්යාවේ තේ වගා කරන උස්බිම්වල සිසිල් උෂ්ණත්වය, ප්‍රමාණවත් වර්ෂාපතනය ගිනිකඳු මැටි සහ සාරවත් පස, වැනි තත්ත්ව හේතුවී තිබේ. කෙන්යාවේ නිවර්තන දේශගුණය සහ සාරවත් ගිනිකඳු පස (Volcanic Soil) තේවල දීප්තිමත් වර්ණය සහ සුවඳ සඳහා හේතු වී ඇත. එසේම කෙන්යාවේ තේ කර්මාන්තයේ විශාල කොටසක් සී.ටී.සී. (CTC - Crush" Tear" Curl) ක්‍රමයෙන් නිපදවන කළු තේය. මෙම තේ, තේ බෑග් (Tea Bag) සඳහා ඉතා සුදුසුය. එසේම හොඳ රසයක් මෙන්ම කිරි සමඟ පානය කිරීමට සුදුසුය. ඊට අමතරව දැවන්ත ජාත්‍යන්තර තේ සමාගම්වල වෙනත් තේ සමග මිශ්‍ර කිරීම (blending) සඳහා ද භාවිත වේ. කෙන්යාවේ අපනයන තේවල 99%කට වැඩි ප්‍රමාණයක් කළු සී.ටී.සී. තේ (Black CTC Tea) වේ. එසේම කෙන්යා තේ සංවර්ධන ඒජන්සිය (Kenya Tea Development Agency - KTDA) හරහා කුඩා තේ ගොවීන් සංවිධානය වී කර්මාන්තශාලා, සැකසුම් සහ වෙළඳපොළ සමඟ ශක්තිමත් ජාලයක් නිර්මාණය කර ගෙන ඇත. මෙම සංවිධානාත්මක ක්‍රමය නිසා කුඩා ගොවීන්ට ජාත්‍යන්තර වෙළඳපොළ මිලට සාපේක්ෂව සාධාරණ මිලක් ලබාග ැනීමට ද හැකි වී තිබේ. එසේම කෙන්යාවේ දේශීය තේ පරිභෝජනය සාපේක්ෂව අඩුය. එබැවින් නිෂ්පාදනයෙන් විශාල කොටසක් විදේශ වෙළඳපොළට යොමු වේ. ඔවුන් 2018 දී කෙන්යාව නිෂ්පාදනය කළ තේවලින් 80% ක් අපනයනය කර ඇත.මෙය ශ්‍රී ලංකාවට වැදගත් පාඩමකි. නිෂ්පාදනය පමණක් නොව, ශක්තිමත් අපනයන සැපයුම් ජාලයක් (Export-supply chain) එකක් තිබීමත් වැදගත් වේ.

චීනය සහ කෙන්යාව ඉදිරියට පැමිණීමෙන් පෙනෙන්නේ තේ අපනයනයේ ජයග්‍රහණය නිෂ්පාදන ප්‍රමාණය මත පමණක් තීරණය නොව බවයි. නිෂ්පාදන ඵලදායිතාව වැඩි කිරීම නව තේ වර්ග හා නිෂ්පාදන හඳුන්වාදීම කුඩා ගොවීන්ගේ කාර්යක්ෂමතාව වැඩි කිරීම,නව අගය එකතු කල (Value Added) වර්ග ශක්තිමත් ජාත්‍යන්තර වෙළඳපොළ හා සැපයුම් ජාලයක් පවත්වා ගැනීම වේ. එනම් කෙන්යාවෙන් පෙනෙන්නේ විශාල ප්‍රමාණයේ කළු තේ කාර්යක්ෂමව නිෂ්පාදනය කර අපනයනය කිරීම ලෝක වෙළඳපොළේ ප්‍රබල ස්ථානයක් ලබාගැනීමට උපකාරී වන බවයි. චීනයෙන් පෙනෙන්නේ එක් තේ වර්ගයකට සීමා නොවී විවිධ තේ වර්ග, විශාල නිෂ්පාදනය සහ විශාල දේශීය වෙළඳපොළක් එකට පවත්වාගෙන යාමේ වාසියයි.

නමුත් ශ්‍රී ලංකාවේ තේ වගා භූමියෙන් ලබාගන්නා ඒකක අස්වැන්න කෙන්යාව වට වඩා අඩු වී ඇත. තේ පඳුරක් දිගු කාලයක් අමු දලු නිෂ්පාදනය කළ හැකි නමුත් වයස වැඩි වීමත් සමඟ ඵලදායිතාව අඩු වේ. ශ්‍රී ලංකාවේ ප්‍රමාණවත් වේගයකින් පැරණි තේ පඳුරු ඉවත් කර ඉහළ ඵලදායි නව ප්‍රභේද නැවත වගා කිරීම (Replanting) සිදු වී නැත. තේ වගාව ශ්‍රමය බහුලව අවශ්‍ය කර්මාන්තයකි. විශේෂයෙන් තේ දළු නෙලීම සම්පූර්ණයෙන් යන්ත්‍රගත කිරීම අපහසුය.

ශ්‍රී ලංකාවේ වැටුප්, සේවක ප්‍රතිලාභ සහ අනෙකුත් ශ්‍රම වියදම් ඉහළ යාම සමඟ නිෂ්පාදන වියදම වැඩි විය. ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ ඉහළ ශ්‍රම වියදම් හා ඵලදායිතාව අතර ගැටලුවක් ඇත. ඒ අනුව තේ කිලෝග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය ඉහළ යාම සිදුව ඇත.

70 දශකයේ වතු ජනසතුව හේතුවෙන් තේ වතු විශාල කොටසක් රජය යටතට ගැනීමත් සමඟ කළමනාකරණ හා ආයෝජන ගැටලු ඇති විය. එසේම එම කාලයේ කළමනාකරණයේ වූ අකාර්යක්ෂමතා, අඩු ආයෝජන, බදු ප්‍රතිපත්ති සහ ශ්‍රම වෙළඳපොළ මැදිහත්වීම් තේ කර්මාන්තයේ කඩා වැටීමට බලපෑ බව නොරහසකි. පසුව 1992-93 කාලයේ රාජ්‍ය වතු කළමනාකරණය පෞද්ගලික අංශයට ලබාදීම සිදු විය. නමුත් ඉන් ප්‍රගතියක් අත් නොවිනි.

තේ යනු දේශගුණික තත්ත්වයන්ට ඉතා සංවේදී බෝගයකි. ශ්‍රී ලංකාවේ නියඟ අධික වර්ෂාපතනය, ගංවතුර, උෂ්ණත්ව වෙනස්වීම් , පසෙහි තත්ත්වය පහළ යාම වැනි කරුණු තේ නිෂ්පාදනයට බලපායි. තේ නිෂ්පාදනයේදී වැටුප් පමණක් නොව පොහොර, ඉන්ධන

විදුලිය,ප්‍රවාහනය ,කර්මාන්තශාලා නඩත්තුව අඩු ඵලදායිතාව, ඉහළ පොදු කාර්ය පිරිවැය (Overhead Cost), දේශගුණික බලපෑම් නිසා නිෂ්පාදන පිරිවැය ඉහළ ගොස් ඇත. එසේම වටිනාකම් එකතු කළ (Value Added) තේ නිෂ්පාදනවල ප්‍රමාණවත් වර්ධනයක් නොමැති වීම මෙම අපනයන කඩාවැටීමට හේතුවී ඇත.

සම්ප්‍රදායික තේ කොළ නිෂ්පාදනය කර තොග තේ ( bulk tea) ලෙස විකිණීමෙන් ලැබෙන ආදායමට වඩා තේ බෑග් (Tea bags), සන්නාමගත තේ (branded tea), විශේෂිත තේ (specialty tea ), ක්ෂණික තේ (Instant tea) වැනි නිෂ්පාදන මගින් වැඩි වටිනාකමක් ලබාගත හැකිය. ශ්‍රී ලංකාවට "Ceylon Tea" නමින් ශක්තිමත් brand එකක් තිබුණත්, එහි සම්පූර්ණ වාණිජ වටිනාකම තවදුරටත් උපරිම කරගැනීම අභියෝගයකි.

*තෙලිජ්ජවිල*
*වජිර පූජිත ගුණවර්ධන*

# ධනවාදයේ නිර්මිතයක් වන දේශගුණික අර්බුධයට මාක්ස්වාදී ප්‍රවේශයක්

පසුගිය අගෝ. 26 වෙනිදා නෙපාලයේ ත්‍රිෂූලි නිම්නයට හිරු උදා වූනේ අනේ සියලුම දියන්හි හිරු උදා වූ ආකාරයෙන්ම වුවද එම දිනය අන් අන් කිසිඳු දිනයක් හා සමාන කළ හැකි වන්නේ නැහැ. එම ප්‍රදේශයේ සියළුම දෙනා කලින් සැළසුම් කර තිබූ වැඩ රාජකාරි සඳහා පිටත් වූ නමුත් ඔවුන්ට ඒවා ඒ ආකාරයට ඉටු කරන්නට හැකියාවක් ලැබුනේ නැහැ. මිනිත්තු කිහිපයක් ඇතුළත ඒ සෑම දෙයක්ම සුනු විසුනු කර දමන්නද ස්වභාවධර්මය කටයුතු කළා. ටිබෙට්-නේපාල දේශසීමාවේ දී ග්ලැසියරයක් නායයාමෙන් ඇති වූ ක්ෂණික ගංවතුර මුළු ත්‍රිෂූලී නිම්නයම සෝදාපාළුවට ලක්කරමින් පහලට ගලා ගියා.

මෙය ගැලැසියර නායයාම නිසා ඇති වූ පළමු ගංවතුර නොවන නමුත්, ලෝකය පුරාවට ආන්තීය කාලගුණික සිදුවීම් සහ ස්වාභාවික විපත් ඇතිවීමේ සීඝ්‍රතාවය වැඩිවී ඇති බව අපිට දැකිය හැකි කාරණාවකි. පසුගිය වසර පුරාවට ලංකාවට, ඉන්දුනීසියාවට බලපෑ දැවැන්ත සුළි කුණාටු, උතුරු අර්ධගෝලය පුරා පැතිර ගිය ලැව් ගිණි සහ දැඩි උණුසුම් තත්වය, ඇතුළුව ලොව පුරා මෙවැනි සිදුවීම ගණණාවක් පසුගිය වසරක පමණ කාලය තුළ අපට අසන්නට ලැබුනි. පසුගිය වසර තුළ පමණක් ලොව පුරා මිනිසුන් 700,000ක් පමණ දේශගුනික අර්බුදයේ සෘජු බලපෑම නිසා මියගිය බව ලාන්ස්ලට් කවුන්ට්ඩවුන් ඇත්තමේන්තු කරයි. මෙය පෙනහළු පිලිකාවලින් වසරකට මියයන ප්‍රමාණයෙන් ආසන්න වශයෙක් අඩකි.

ලොව පුරා පරිසර විද්‍යාඥයන් පවසන ආකාරයට 2030 වන විට අප විමෝචනය කරන කාබන් ප්‍රමාණය 45%කින් අඩුකර නොගතහොත් සහ ගෝලීය සාමාන්‍ය උෂ්නත්වය 1.50ක කට වඩා ඉහළ ගියහොත් නැවත හැරවිය නොහැකි ලෙස අපගේ පාරිසරික සහ දේශගුණික පද්ධතිය බිඳවැටෙනු ඇති.

එකිනෙකට බැඳී ඇති පරිසර පද්ධතියේ බිඳවැටීමත් ජෛවගෝලයේ බිඳවැටීමත් සමඟ මේ වන විට අප සිටින්නේ සමූහ වඳ වී යාමේ සංසිද්ධියක් තුළ බව බොහෝ පරිසර විද්‍යාඥයන්ගේ මතය වි තිබේ. මීට පෙර පෘථිවි ඉතිහාසය තුළ මෙවැනි වඳවීයාම් 5ක් සිදුව ඇති අතර පෘථිවියේ ජීවත් වූ ජීවී කොට්ඨාශ වලින් 75%කට වඩා වඳවීමට ලක්වන අවස්ථාවන් මෙසේ සැළකේ. නමුත් මෙවර මෙහි ඇති විශේෂත්වය වන්නේ මෙම සමූහ වඳ වී යාමේ සංසිද්ධියට බලපාන ප්‍රධාන හේතුව මිනිස් ක්‍රියාකාරකම් වීමයි.

## දේශගුණික අර්බුධය ඕපපාතිකව පහළවූවක්ද?

දේශගුණික අර්බුදය ඕපපාතිකව පහලවූවක් නොවේ. ධනවාදී නිශ්පාදන ක්‍රමය තුළ වැඩි ලාභය අරමුණු කරගනිමින් පරිසරයට දූෂක ටොන් බිලියන ගණනින් දිනපතා මුදාහැරීම තුළ අප ජීවත්වන පරිසරය මිනිස්සුන්ට පමණක් නොව සමස්ථ ජෛව වර්ගයාටම ජීවත්විය නොහැකි වටපිටාවක් බවට අප විසින් පත් කරමින් සිටිති.

මාක්ස් ප්‍රකාශ කළ පරිදි

*"ධනේශ්වර නිෂ්පාදනය විසින් තාක්ෂණය සහ විවිධ ක්‍රියාවලීන් එකිනෙක සම්බන්ධ කරමින් සමස්ත සමාජීය පද්ධතියක් නිර්මාණය කරනු ලබන්නේ, සියලු ධනයේ මූලික උල්පත් දෙක වන පස සහ කම්කරුවා විනාශමුඛයට පත්කරමිනි."*

මෙය වර්ථමානයට ආදේශකළහොත් ධනවාදය ක්‍රියාත්මක වන ආකාරය එනම් අසීමිත ලාභය මූලික කරගත් කරන ප්‍රාග්ධන සමුච්චයනය ධනවාදය සතු ප්‍රධානතම සම්පත් දෙක වන මිනිස් ශ්‍රමය සහ ස්වාභාවික පරිසරය යන දෙකම විනාශයට පත්කරයි.

කාර්මික විප්ලවය ආරම්භයේ සිට ධනවාදයේ නැඟීම සමඟ කාර්මික දියුණුව අත්පත් කරගත් සෑම රටක්ම ඒ ක්‍රියාවළිය සඳහා අවශ්‍ය බලශක්තිය ලබාගැනීමට ඛණිජතෙල් සහ ගල් අඟුරු අසීමිතව දහනය කිරීම තුලින් හරිතාගාර වායූන් නිකුත් කිරීමේ සිට ඒ සඳහා අවශ්‍ය ඛණිජ නිෂ්සාරනය සඳහා දැවැන්ත පතල් කැනීම, වනාන්තර විනාශ්‍ය ආදී වශයෙන් නොයෙක් ආකාරයෙන් පරිසරය විනාශ කිරීමට කටයුතු කරන ලදී. මෙසේ සිදුකරන ලද පරිසර විනාශය හේතුවෙන් ප්‍රාදේශීය මට්ටමන් ගැටළු උද්ගතවන විට ඔවුන් එම ක්‍රියාවලියන් සිය දේශ සීමාවෙන් එපිට ගෝලීය දකුණේ රටවල් කරා ගෙනයාමට කටයුතු කරන ලදී.



අප්‍රිකාව, ආසියාව සහ දකුනු ඇමෙරිකාව මෙම ක්‍රියාවලියේ ප්‍රධානතම ගොදුරු බවට පත්විය. නමුත් පාරිසරික අර්බුදය තනි රටකට හෝ කළාපයකට පමණක් බලපාන්නක් නොව සමස්ත ගෝලීය පරිසර පද්ධතියටම බලපාන ගැටළුවක් බව අනාවරණය වීමෙන් පසුවත් ධනවාදී නිශ්පාදන යාන්ත්‍රණය එයට ස්ථිරසාර පිළියම් යෙදීමට කල්මරමින් සිටිති. ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් දේශගුණික අර්බුදය යනු බොරුවක් බව පැවසූයේ මීට වසර කිහිපයකට කලිනි. එමෙන්ම ලොව පුරා විහිද ඇති නව ලිබරල් ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කරන ඛනිජතෙල් සහ පතල් කර්මාන්තය හා සම්බන්ද සමාගම් වලින් යැපෙන ඇට්ලස් නෙට්වර්ක් වැනි පර්යේෂන ආයතන දේශගුණික අර්බුධයේ සැබෑ අවදානම පිළිබඳ කතාබහ තනුක කිරීමට මෙන්ම අමු අමුවේ ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරමින් සිටිති.

## ධනවාදී සංස්ථාපිතය යෝජනා කරන දියාරු විසඳුම්

මේවන විට ධනවාදී යාන්ත්‍රණය විසින් මේ වෙනුවෙන් ඉදිරිපත් කර ඇති විසඳුම වන්නේ මේ මොහොතේ සිට සළකමින් අඩු කාබන් විමෝචනයක් සිදුකරන රටවලට ඔවුන් විසින් ලබාගත් ණය ඒ වෙනුවෙන් හිලව් කරගැනීමට හැකි මූළ්‍ය ක්‍රමවේදයක් හඳුන්වාදීමයි.

මේ හරහා අඩු කාබන් විමෝචනයක් සිදුකරන අප වැනි රටවල් එලෙසින් අඩු කාබන් විමෝචනයක් පවත්වාගෙන යෑම වෙනුවෙන් අප මෙතෙක් ලබාගෙන ඇති ණය වලින් කොටසක් කපාහැරීමට ඔවුන් යෝජනා කරති.

මේ ක්‍රියාවලිය හරහා ඔවුන් දේශගුනික අර්බුදය නිසා වැඩියෙන්ම බැටකෑමට ලක්වන අඩු කාබන් විමෝචනයක් සිදු කරන ගෝලීය දකුණේ රටවල් පිළිබඳ වගකීමෙන් බැහැරවීමට සූක්ෂම ලෙස කටයුතු කරමින් සිටිති.

මේ යෝජනාව තුළ මෙතෙක් කාලයක් සිදුකරගෙන ආ කබන් විමෝචනය, දිගුකාලීනව සිදුකරන ලද සූරාකෑම, ඒ හේතුවෙන් ඇතිව ඇති අසමාන සංවර්ධනය ගැන කිසිඳු අවදානයක් යොමු නොකරනවාක් මෙන්ම අදාළ අඩු කාබන් විමෝචනයක් පවත්වාගෙන යාම අතරතුර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමට අවශ්‍ය පුනර්ජනනීය බලශක්ති විසඳුම් හඳුන්වාදීම හෝ හරිත තාක්ෂණය බෙදාගැනීම හෝ ගැන කිසිඳු කතාබහක් සිදු කරන්නේ නැත. එමෙන්ම මේ හරහා අධි පරිභෝජනයක් සිදුකරන රටවල් අධෛර්‍ය කරන්නේද නැත. එමෙන්ම දේශගුණික අර්බුදය නිසා එල්ලවිය හැකි ව්‍යසන වලට මුහුන දීමට හැකියාව අඩු අප වැනි ගෝලීය දකුණේ රටවලට වගවීමක් මේ විසඳුම් තුළ අඩංගුවන්නේ ද නැත.

මෙහිදී අප ප්‍රධානකොටම සැළකීමට ගතයුතු කරාණාව වන්නේ මේ අර්බුදය ඇතිවීමට වගකිවයුතු වන්නේ අපවැනි ගෝලීය දකුණේ රටවල් නොවන බවයි. අප වැනි ගෝලීය දකුනේ රටවල් අති බහුතරයක් ඉතා අඩු කාබන් විමෝචනයක් සිදුකරන අතරම අපගේ පරිභෝජනයට ඇත්තේ ඉතාම අවම මට්ටමකය. එමෙන්ම චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, වැනි රටවල් වැඩි කාබන් විමෝචනයක් සිදුකරන නමුත් ඉන් වැඩි ප්‍රමාණයක් ඔවුන්ගේ පරිභෝජනය සඳහා සිදුකරන ලද කාබන් විමෝචනයක් නොවේ. එම රටවල පවතින ලිහිල් පාරිසරික සහ කම්කරු රෙගුලාසිවල ප්‍රයෝජනයට ගැනීමේ අරමුණෙන් ප්‍රධාන ධනපති අධිරාජ්‍යවාදී රටවල් තමන්ගේ නිශ්පාදන ක්‍රියාවලිය එම රාජ්‍යවලට ගෙනයනු ලැබීය. උදාහරණයක් ලෙස ගතහොත් ඉන්දියාව විසින් සිදුකරන කාබන් විමෝචනයෙන් 20%කට ආසන්න ප්‍රමාණයක් ඔවුන්ගේ පරිභෝජනය සඳහා නොවන අපනයන හා සම්බන්ද කාබන් විමෝචනයන් වේ.

මෙහි ඇති වඩාත්ම කැපීපෙනෙන දෝෂය නම් මේ ක්‍රියාවලිය තුළ ගෝලීය උතුරේ රටවල් මේ දක්වා දේශගුණික අර්බුධය සඳහා ඔවුන් විසින් සිදුකරන ලද දායකත්වය සම්බන්දයෙන් වගකීමක් ගැනීම සම්පූර්ණයෙන්ම මඟහැරීමයි.

දේශගුණික අර්බුදය සම්බන්දයෙන් ධනවාදී සංස්ථාපිතිය විසින් මේ ඉදිරිපත් කර ඇති යෝජනාව සමස්ථ මනුෂ්‍ය සංහතියේ පැවැත්ම අතිශ්‍ය අවදානම්ව පවතින අවස්තාවක පවා ලාභය උපරිම කරගැනීමට ඇති හැකියාව සම්බන්දයෙන් කටයුතු කරන යෝජනාවකි.

තත්වය මෙසේ වෙද්දී ශ්‍රී ලංකාවේ වත්මන් රජය මේ යෝජනාව හිස්මුදුනින් පිලිගැනීමට කටයුතු කරමින් සිටී.

## විසඳුම

දේශගුණික අර්බුදයට ධනවාදයට විසඳුම් සැපයිය නොහැකි බව අවබෝධකරගැනීමට මාක්ස්වාදියෙකු වියයුතු නොවේ.

වරක් ජනප්‍රිය පරිසර ක්‍රියාකාරිනියක් වන ග්‍රේටා තන්බර්ග් ප්‍රකාශ කළ පරිදි

*"දේශගුණික අර්බුධය යනු සීමිත ලෝකයක් තුළ අසීමිත වර්ධනයක් අත්පත් කරගත හැකිය යන වැරදි ආකල්පය මත පදනම්ව ඇති අපගේ වර්ථමාන ආර්ථික ක්‍රමයේ නිර්මානයකි."*

දේශගුණික අර්බුදය ඇතිවීමට හේතුසාධක වූ ආර්ථික ක්‍රමය තුළින් ඒ සඳහා විසඳුම් ඉදිරිපත් කළ හැකියයි සිදීම විහිළුවකි. එයට විසඳුමක් ඉදිරිපත් කළ හැක්කේ ලාභය සහ ප්‍රාග්ධන පොදිබැඳගැනීම වෙනුවට සමාජීය වගකීම සහ අන්යෝන්‍ය පැවැත්ම පෙරදැරි කරගත් මාක්ස්වාදී ආර්ථික ක්‍රමයක් තුළිනි.

ධනවාදී සංවර්ධන ක්‍රියාවලිය තුළ ඇති අසමාන සංවර්ධනය හේතුවෙන් ඇතිව ඇති විශමතා අවම කිරීමට සඳහා ගෝලීය දකුණේ රටවල් සමඟ වඩා පරිසර හිතකාමී නවීන තාක්ෂණය බෙදාගැනීම, පුනර්ජනනීය බලශක්තිය ඇතුළු වඩාත් කාර්‍යක්ෂම සහ අවම පාරිසරික බලපෑමක් ඇතිවන ලෙසට යටිතළ පහසුකම් නිර්මාණය කිරීම. දේශගුණික අර්බුදය නිසා ඇතිවිය හැකි හදිසි ආපදා සඳහා අවැසි යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම ඇතුළු සාමූහිකව දේශගුණික අර්බුදයේ වගකීම බෙදාගැනීමට සහ එයට මුහුනදීමට ධනවාදයට හැකියාවක් නැත.

දේශගුණික අර්බුදයට මුහුණදියහැකි ආර්ථික වැඩපිළිවෙළක් නිර්මාණය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට හැකිවන්නේ ජාත්‍යන්තර දැක්මක් සහිත සමාජවාදී වැඩපිළිවෙලක් මත පදනම් වන කම්කරු පන්තියේ පාලනයක් තුළින් පමණි.

*ප්‍රසාද් වැලිකුඹුර*

## සංගීත විශාරද නන්දා මාලනී

## විකල්ප සංකල්ප ගීතයේ

# අඬහැරය

මිටියාවත මැදින්

මෙරට ගීත කලාව ගැන විමසන කාහට වුවද නන්දා මාලනී නම් වූ සංගීතවේදී මහ ගායිකාව පිළිබඳ කථා නොකර කිසිවක් ලියන්නට කියන්නට හැකි නොවේ. පිට පළාතකින් කොළඹ කොටහේන පදිංචි ඇයගේ පවුලේ උදවිය සහ ඇය දැඩි දරිද්‍රතාවයෙන් ජීවත් වූ බව ඇයගේ මුවින් පවසා ඇත. කොටහේන ගුණානන්ද විද්‍යාලයෙන් මනාසේ අධ්‍යාපනය ලද ඇය නැණවත් ගුණවත් හා කලාවට ඉතා ලැදී මෙන්ම ගී ගැයුමට සුවිශේෂි හැකියාවක් පළ කළ බාලිකාවක ලෙස එදා ලංකා ගුවන් විදුලි සේවයේ ළමා මණ්ඩපය හරහා ය. එම වැඩ සටහන නිෂ්පාදනය කර ඉදිරිපත් කළ ප්‍රවීන ගීපද රචක නිවේදක



කරුණාරත්න අබේසේකර ශූරින් වෙතින් ය. එහිදි ඇය '' බුදු සාදු මම සමන් මගක් වෙන්නම්'' ගීතය ගායනා කරමින් මහ සංගීතවේදී පණ්ඩිත් අමරදේවයන්ගේ අත දීමෙන් සංගීත ලොවට පිවිසියා ය. දිනෙන් දින ප්‍රගතිය කරා පියවර තබමින් ශ්‍රී ලංකා සංගීත අම්බරයේ හරවත්ව දිදුලන තාරකාවක් බවට පත්වූ බව පාඨක රසික පිරිස් මැනවින් දනිති.

එදා ඇයගේ පිවිසීම හා ඇයගේ සංගීත භාවිතා රටාව තුළ කිසියම් ආකර්ෂණීය රසයක් මෙන්ම වෙනසක් රසික සමාජයට දැණුන බව සටහන් කළ හැකිය. විවිධ රචකයන්ගේ සංගීතවේදින්ගේ නිර්මාණ ගයමින් ආදරය ප්‍රේමයේ සෞන්දර්‍යාත්මක මිහිර මෙන්ම විප්‍රයෝගයේ දෝමනස්සය ජීවිතයේ විපුලත්වය මැනවින් රසික සිත් අවදි කළ ඇය, පසු කාලයේ දී ඩෝල්ටන් අල්විස් රචනා කළ පණ්ඩිත් අමරදේව සංගීතවත් කළ '' උඩගුලියන් ගොතා බඳින නීල වරල සරසන්නට මා පිපුණේ නැත මේ දෙරණේ'' ගීතය ගායනයෙන් ගීතයේ විකල්ප සංකල්පනා තලයකට ප්‍රවේශ වූ බවක් රසිකයාට දැණුනා විය හැක. 70 දශකයේ උඩගුලියන් ඔස්සේ ඇය තැබූ පියවර හේතුවෙන් බුද්ධිමත් රසික ජන ප්‍රතිචාර, සංගීත ලොවේ ඇය හරවත් තැනක තබන්නට හේතුඋනී.

ජනතා දුප්පත්කමත් පාලකයන්ගේ දූෂිත බවත් නිසා සැමදා දුක සඳුල බුදින ආසියානුවන් වන මෙරට ජනතාවගෙන් බහුතරයකට ජීවිතයේ මෙන්ම කලාවේ රස ශෘංගාරය ආනන්දය සෞන්දර්‍යාස්වාදය නිදහසේ ආර්ථිකව සැනසීමෙන් විඳීමට 1948 පසු දවසක් උදා වූයේ යැයි කිව හැකි ද රෑ සෑම දෙනාම නොව බොහෝමයක් දේශපාලකයන් ජනතාවට අයිති සම්පත් තමන්ගේ උදර පෝෂනය සඳහා කොල්ල කෑ බව දේශපාලන හා සමාජ ගවේෂකයන්ගේ මතයයි. මෙකී දේශපාලන හා සමාජ කතිකා ඔස්සේ සමාජය තුළ නිරන්තර අවදි වූ අදහස් වූයේ මෙරට පාලක සනුහරය ජන සතුරන් සේ ක්‍රියා කරමින් ජනමතය උදුරාගෙන උන්ම සිංහාසනාරූඪව ජනතාව පෙළා දමන දුෂ්ඨයන්ව සිටින බව ය. දේශපාලනික වශයෙන් මෙම සියළු දුර්භාග්‍යන් පැවැතිය ද '' සකුරා මල් පිපිලාස හද විල කළඹන පෙම් ජල රේඛා, මේ සිංහල අපගේ රටයි'' ආදි විවිධ ගී ගැයූ නන්දා මාලනී ගායන ශිල්පිනිය ඇය සතු ගායනිය ප්‍රකාශන ගුණය මෙන්ම ප්‍රතිභාව ඔස්සේ ගී ලොව අද්විතිය ප්‍රවේශයකට එළැඹිනී. එය නම් අග්‍රගණ්‍ය ගීපද රචක ගත් කතුවරයෙකු හා සිනමා අදියුරු මහචාර්‍ය සුනිල් ආරියරත්න ගී නිර්මාණකරනයේ හඬ ශ්ල්පිනිය බවට පත් වීමයි. සැබැවින්ම ඇය ගී ලොව විකල්ප ගී ගයන ප්‍රබල ශිල්පිනියක් බවට පත්වන්නේ සුනිල් ආරියරත්නගේ සංකල්පනා හා ඔහුගේ මෙහෙයවීම නිසාම බව උපකල්පනය කළ හැකි ය. ඇය ගැයූ '' සත්‍යයේ ගීතය හා පවන'' ආදි විරෝධාකල්ප ගීතාවලිය දූෂිත පාලනයට එරෙහිව ජන හදවත්



අවදි කරන්නට අති ප්‍රබල දායකත්වයක් ලබා දුන් කීම සාධාරණය.

''පූජාසනයේ ඔබ හිඳුවා ඔබට පුදන මේ ලෝකයමයි හෙට ඔබට එරෙහිවී නැගිටින්නේ'' ආදි ලෙස මහචාර්‍යතුමා ලියා දුන් විකල්ප ගී සකල්පනා සිය ගණනක් ජනතාවගේ ආකල්ප අවදි කිරීම උදෙසා ඇය ගායනා කළා ය. ජනතා අයිතින් දිනාගනු උදෙසා ඇය ගායනයෙන් කළ මෙහෙවර ද මහචාර්‍යතුමාගේ රචනා කෞශල්‍යය හා කැපවීම මෙන්ම ඔවුනගේ නිර්භීතබාවය ද බහුතර ජනතාවකගේ අගයට බඳුන් වුනී. නමුදු එකී විකල්ප සංගල්ප නිසාම පාලක බලවතුන්ගේ තර්ජන හමුවේ ජීවිතය රැකගනු සඳහා රට හැරදා යන්නට මහචාර්‍යතුමාටත් ගායිකා නන්දා මාලනිටත් සිදුවූ බව ප්‍රකට ය. සැබැවින්ම ස්වකීය රට ජාතිය එහි සහෝදර ජනතාව මෙන්ම ආදරය ප්‍රේමය සම්ප්‍රයෝග විප්‍රයෝග සංකල්පනා පිළිබඳ මහචාර්‍ය සුනිල් ආරියරත්නයන්ගේ හෘද සාක්ෂියේ ප්‍රතිබිම්බයක් නන්දා මාලනී ගායනාවේදිනියගේ සුගායනීයස්වරයයි.

***මාධ්‍යවේදි ගී පද රචක ග්‍රන්ථ කතෘ***
***යාපා බණ්ඩාර සෙනවිරත්න***

# USP

## වැඩ පිළිවෙලේ සාරාංශය

- ශ්‍රී ලංකාව මුහුණ දෙන ආර්ථික අර්බුදයේ ගැඹුරු ස්වභාවය තේරුම් ගනිමින් ඊට විසඳුම් සපයන කෙටිකාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන අවබෝධයකින් යුක්තවූ හදිසි ආර්ථික සැලැස්මක් ක්‍රියාත්මක කිරීම
- IMF, India, China ඇතුලු විදේශීය රට වලට ණය ගෙවීම ප්‍රතික්ෂේප කිරීම හා දේශීය ගොවීන්, ධීවරයන්ගේ සහ කුඩා ව්‍යාපාරවල ක්ෂුද්‍ර ණය ඇතුළු සියලුම දුගී ජනතාව ලබා ගෙන තිබෙන ණය වහාම කපා හැරීම හා ඒ සමග මතුවිය හැකි අභියෝග වලට මුහුණ දීම වෙනුවෙන් ලංකීය සමාජය පෙළ ගැස්සවීම.
- චීනය/ඉන්දියාව/බටහිර රටවල් ඇතුලු ප්‍රකෝටිපතියන් සමග රටට අහිතකර ලෙස ඇති කර තිබෙන සියලුම ගිවිසුම් ආපසු හැරවීම ආරම්භ කිරීම.
- අධ්‍යාපනය, සෞඛ්‍ය සහ බලශක්තිය ක්ෂේත්‍ර වල දැනට සිදුවෙමින් පවතින සියලුම පුද්ගලීකරණ ක්‍රියාදාමය ආපසු හැරවීමට පියවර ගැනීම.
- නව ලිබරල්වාදී වැඩ පිළිවෙලට අනුව සිදුවන ජාතික සම්පත් දේශීය හා විදේශීය ජාවාරම් කරුවන්ට විකිණීම නවතා දමන අතර මහ බැංකුව ඇතුළු බැංකු, රක්ෂණය, වරාය හා ගුවන් තොටුපල වැනි ආර්ථිකයේ ප්‍රධාන බල මධ්‍යස්ථාන ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පාලනයක් යටතේ ජනසතු කිරීම.
- ගොවීන් හා ධීවරයින් වැනි අඩු ආදායම් ලාභීන් සඳහා ලබාදෙන අත්‍යවශ්‍ය ආහාර සහනාධාරය වැඩි කිරීම. ලක්ෂ 40ක් ලෙස ගනනය කර තිබෙන රැකියා විරහිත සහ දුප්පත් පවුල් සඳහා ප්‍රමාණවත් සහනදායි වැඩ පිළිවෙලක් වහාම ක්‍රියාවට නැංවීම.
- සේවකයින්ගේ ඡන්දයෙන් ප්‍රජාතන්ත්‍රවාදීව තෝරා පත් කර ගන්නා ලද කම්කරු කමිටු වල අධීක්ෂණය යටතේ සියලුම අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා මිල පාලනයක් හඳුන්වා දීම.
- ප්‍රාග්ධනය විදේශ රට වලට ගලායාම නතර කිරීම සඳහා වන ප්‍රාග්ධන පාලන ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- ජනතාව පීඩනයට පත් කරන Vat බදු ප්‍රතිපත්තිය වහා සංශෝධනය කරන අතර සුපිරි ධනවත් පුද්ගලයන් මත විශේෂිත ධන බද්දක් පැනවීම හා ඔවුන් විසින් බදු නොගෙවීම වළක්වා ගැනීම සඳහා අවශ්‍ය කඩිනම් පියවර ගැනීම.
- රාජ්‍ය අංශය විධිමත් කිරීම සැලසුම් කරමින් අධ්‍යාපනය සහ සෞඛ්‍ය සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කරන අතර අධ්‍යාපනය සහ සෞඛ්‍යය සම්පූර්ණයෙන්ම නොමිලේ ලබා දීමට කටයුතු කිරීම.
- පරිසරය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර පරිසර හිතකාමී ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා තිරසාර සැලසුම් සහගත දිගු කාලීන ආර්ථිකයක් සඳහා සැලසුම් කර පරිසරයට අහිතකර සියලුම ව්‍යාපෘති අවලංගු කිරීම.
- රටට අවශ්‍ය කරන ආහාර භෝග නිෂ්පාදනය සඳහා ගොවි ජනතාවට අවශ්‍ය ඉඩම්, ජලය හා පොහොර පහසුකම් ලබා දීම සඳහා ගොවි නියෝජිතයින් ඇතුලත් මෙහෙයුම් කමිටු දිස්ත්‍රික්ක මට්ටමින් පත් කර ඒවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම් රජය මගින් සැපයීම.
- විදේශ වෙළඳාම සහ රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රාග්ධනයේ අවශ්‍යතාවයන් සඳහා නොව මහජනතාවගේ යහපත සඳහා විය යුතු අතර ජාත්‍යන්තර සහයෝගීතාවය මත පදනම් වූ ස්වාධීන විදේශ ප්‍රතිපත්තියක් සැකසීම.
- විධායක ජනාධිපති ක්‍රමය වහා අහෝසි කර මන්ත්‍රිවරු තෝරා පත් කිරීම සඳහා කොට්ඨාශ මට්ටමින් හා ඡන්ද අනුපාත අනුව පත්වන ක්‍රමයක් හඳුන්වාදීම.
- කුරිරු ත්‍රස්ත නීතිය සහ සමාජ මාධ්‍ය විරෝධී නීති ඇතුළු සියලුම ප්‍රජාතන්ත්‍ර විරෝධී නීති වහාම අහෝසි කිරීම.
- ආගම් ඇදහීමේ අයිතිය සහ ආගමක් නොඇදහීමට ඇති අයිතිය ආරක්ෂා කිරීම හා මුස්ලිම් ජනතාව ඇතුලුව ආගමික නිදහසට ඇතිවන බාධා ඉවත් කරමින් සියලු ආගම් රාජ්‍ය පාලනයෙන් සහමුලින්ම නිදහස් කිරීම.
- LGBTQ+ ප්‍රජාව සඳහා සියලුම හිමිකම් වලට ඉඩ සැලසීම.
- ස්වාධීන මාධ්‍යයක් බිහි කිරීම සඳහා ප්‍රාග්ධන හිමි ධනවතුන්ගේ පාලනයෙන් තොර වූ මාධ්‍ය සේවකයින්ගෙන් තේරී පත් වූ නියෝජිතයින්ගේ කමිටු මගින් ස්වාධීන මාධ්‍ය සදාචාරයක් බිහි කිරීම සමග මාධ්‍ය නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, ඇතුලු සියලු ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් තහවුරු කිරීම.
- අධිරාජ්‍යවාදී බලවතුන් විසින් ගෙන යන යුද්ධ හරහා රටවල් හා ප්‍රදේශ බලහත්කාරයෙන් අල්ලා ගැනීම් වලට එරෙහි වෙමින් ලෝකවාසී සියලුම කම්කරුවන් හා පීඩිත ජනතාව අතර ජාත්‍යන්තර සහයෝගීතාවය ගොඩනැගීමට පියවර ගැනීම.
- බහුජන ව්‍යාපාරය විසින් සංවිධානය කරනු ලබන විප්ලවවාදී ව්‍යවස්ථාදායක සභාවක් ගොඩනගන අතර සෑම ජන කොටසකටම පිළිගත හැකි නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳ නැවුම් සංවාදයක් ආරම්භ කිරීමට කටයුතු කිරීම.
- කඳුකරයේ මලයග කම්කරුවන් ඇතුළු සියලුම කම්කරුවන්ගේ වැටුප් උද්ධමනයට ගැලපෙන අයුරින් වහා වැඩි කිරීම සහ අවම වැටුපක් ස්ථාපිත කිරීම සමග සතියකට පැය 35කට සීමාවූ වැඩ මුරයක් ක්‍රියාත්මක කිරීම.
- සමාන වැටුප් ලබා ගැනීමට කාන්තාවන්ට තිබෙන අයිතිය ඇතුළු සියලුම කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට පියවර ගැනීම.
- ජාතික ප්‍රශ්නය විසඳීමේ මූලික පදනම ලෙස දෙමළ ජනතාවගේ ස්වයං නිර්ණ අයිතිය පිළිගැනීම.
- සියලුම දේශපාලන සිරකරුවන් කොන්දේසි විරහිතව වහාම නිදහස් කිරීම.
- අතුරුදන් වූවන් සම්බන්ධයෙන් කඩිනම් විමර්ශනයක් සිදු කර එමගින් ලැබෙන සියලු තොරතුරු ප්‍රසිද්ධියට පත් කිරීම.
- සිවිල් කටයුතු සඳහා හමුදා සහභාගීත්වය වහාම නැවැත්විය යුතු අතර සිවිල් ප්‍රදේශවලින් හමුදාව ඉවත් කිරීමට පියවර ගැනීම.
- බලහත්කාරයෙන් අල්ලාගෙන සිටින සියලුම ඉඩම් එහි මුල් අයිතිකරුවන්ට නිදහස් කිරීමට කටයුතු කරන අතර ඉඩම් නොමැති සැමට වගා කිරීම සඳහා ඉඩම් ලබා දීම.
- ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා ආරම්භක පියවරක් ලෙස 13 වන ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර බලය බෙදා ගැනීමේ ක්‍රියාවලිය පණ ගැන්වීම.

# EPF/ETF
# මංකොල්ලයට එරෙහිව නැගී සිටිමු




සේවක අර්ථසාධක අරමුදල (EPF) යනු වැඩ කරන ජනයාගේ විශ්‍රාමික අනාගතය සුරක්ෂිත කරනවා මෙන්ම සේවයේ යෙදී සිටින අවස්ථාවේ නිවාස ඉදිකිරීම සඳහා ණය ලබා ගත හැකි ලංකාවේ විශාලතම අරමුදලයි. සේවක භාරකාර අරමුදල (ETF) සේවය කරන ආයතනයෙන් ඉවත්වූ විට දායක මුදල තමන්ට ගැනිමට හැකියාව ඇත. නැවත සේවය කළ ආයතනයකින් වසර 5කට පසුව ඉවත් වු විට තමන්ට හිමි මුදල ගැනීමට හැකියාව ඇත. තවද මෙම අරමුදලේ සාමාජිකයෙකු සිටින කාලය තුළ රෝග ආබාධ විශාල ප්‍රමාණයකට හා ශල්‍යකර්මවලට ප්‍රතිලාභ ගැනීමට හැකියාව ඇත. කම්කරුවා වියපත්ව විශ්‍රාම ගැන්වෙන විට මෙන්ම සේවයේ යෙදී සිටින අවස්ථාවේ දරුවන්ට ශිෂ්‍යත්ව ආධාර ලබා දේ.

මාලිමා ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය විසින් (EPF) හා (ETF) අරමුදල මෙතෙක් පැවැති කළමණාකරණය වෙනස් කිරීමට අනුමත කර ඇත. (EPF) හා (ETF) අරමුදල මහ බැංකු පාලනයෙන් ඉවත් කර එය සමාගම් අයිතිකරුවන්, ආණ්ඩුව හා කම්කරු නියෝජිතයින්ගෙන් සමන්විත ත්‍රෛපාර්ශවික කමිටුවකට පැවරීමට එරෙහිව නිදහස් වෘත්තීය සමිති මධ්‍යස්තානය ඇතුලු පුද්ගලික අංශයේ, අර්ධ රාජ්‍ය අංශය හා රාජ්‍ය අංශයේ වෘත්තීය සමිති සමග එකතුව සමග ඒකාබද්ධව ක්‍රියාත්මක වෙමින් පවතී. මාලිමා ආණ්ඩුව (EPF) හා (ETF) අරමුදල් පාලනය වෙනස් කිරීම ගැන බරපතල සැකයක් පවතී. එයට හේතුව ඔවුන් පවසන කාරනා මෙයට පෙර බලයේ සිටි ධනපති පාලකයින් වන මහින්ද රාජපක්ෂ හා රනිල් වික්‍රමසිංහගේ හේතු දැක්වීමට වඩා වෙනසක් නොමැත. රාජපක්ෂලාගේ මෙම කූඨ අරමුණ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ අවස්ථාවේ කටුනායක වෙළඳ කලාපයේ කම්කරුවන් ගෙන ගිය වීරෝධාර අරගලයේ දී රොෂෙන් චානක සහෝදරයාට ජීවිතය පරිත්‍යාග කිරීමට සුදුවු බව මෙහිලා සඳහන් කළ යුතු ය. සැබෑ හේතුව වන්නේ මෙම පනත් සංශෝධනය කිරීමට උවමණාවී ඇත්තේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට බව ප්‍රකට කරුණකි.

මෙම අරමුදල් පාලනයට හාම්පුතුන්ට කිසිම අයිතියක් නැත. මෙම අරමුදල්වල තනි අයිතිය ඇත්තේ කම්කරුවන්ට ය. හාම්පුතුන් පාලනයට සම්බන්ධ වෙනවාට වෘත්තීය සමිති විරුද්ධ හාම්පුතුන් මෙම අරමුල්වල මුදල් කොටස් වෙළඳපොලේ ආයෝජනය කිරීමේ තින්දු ගැනීමේ දි තම ව්‍යාපාරවලට වැඩි ලාභ ගැනීමේ පරමාර්තයෙන් කටයුතු කිරීමට හැකියාව ඇති බැවිනී.

තවද ත්‍රෛපාර්ශවික කමිටුවක් පිහිටුවීමේ දී ආණ්ඩුවේ නියෝජිතයින් ලෙස මාලිමා කේඩර්වරු පත් කළ හැකියාව ඇත. හාම්පුතුන්ගේ නියෝජිතයින් හා වෘත්තීය සමිති නියෝජිතයින් ලෙසත් ජනතා විමුක්ති පෙරමුණේ කාඩර්වරු පත් කළ හැකියාව ඇත. දැනටමත් පවතින ජාතික කම්කරු උපදේශක සභාවේ නියෝජනය මෙම ආණ්ඩුව බලයට පත්වීමෙන් පසුව ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වෘත්තිය සමිති නියෝජිතයින්ගේ සංඛ්‍යාවවැඩි කර පැරණි වෘත්තීය සමිති 2 ක්වන ලංකා වෙළඳ කාර්මික හා පොදු සේවක සංගමය හා එක්සත් කම්කරු සම්මේළනය ඉනක් ඉවත් කර ඇත. එම නිසා හාම්පුතුන් අරමුදල්වල පාලනයට ආණ්ඩුවේ නියෝජිතයින් රිංගවීමට නිදහස් වෘත්තීය සමිති මධ්‍යස්තානය තරයේම විරුද්ධ වෙන්නෙමු.

(EPF) හා (ETF) අරමුදල් රැකගැනීම වෙනුවෙන් නිදහස් වෘත්තීය සමිති මධ්‍යස්තානය යෝජනා කරන්නේ මහ බැංකුව තුළ මෙතෙක් පාලනයේ දී සිදුව ඇතැයි දූෂණ අක්‍රමිතාවලට සම්බන්ධ පුද්ගලයින් අල්ලා ගැනීම සඳහා 2025 වසර දක්වා වොහාරික විගණනයක් පවත්වා වැරදිකරුවන්ට දඩුවම් දීම හා සෑම වසරකම වොහාරික විගණනයක් පැවැත්වීම ය. නැවත එවැනි වැරදි සිදු නොවීමට මහ බැංකුවේ සේවකයින් භුක්ති විඳින අර්ථසාධක අරමුදලේ නීති හා පාලන ව්‍යුහය මෙම අරමුදල්වලට සම්පාදනය කිරීම. අරමුදල්වල දැවන්ත ධනස්කන්ධය හාම්පුතුන්ගේ බැංකු ගිණුම් තර කර ගැනීමට කිසිදු ඉඩක් මාලිමා ආණ්ඩුවට හෝ වෙනත් කිසිදු පාර්ශවයකට ඉඩ නොතැබීමට සමස්ථ කම්කරු පංතිය දැනුවත් කර කම්කරුවන් සංවිධානය කරන බවට නිදහස් වෘත්තීය සමිති මධ්‍යස්තානය ප්‍රතිඥා දෙන්නෙමු.

# පංති සටන පන පොවන තීන්දු ගත් එක්සත් සමාජවාදී පක්ෂ සම්මේලනය

එක්සත් සමාජවාදී පක්ෂයේ 16 වන සම්මේලනය පසුගිය සැප්තැම්බර් මස 19 හා 20 යන දෙදින නාරාහේන්පිට දාබරේ මාවත ප්‍රජාශාලාවේ දී ඉතා සාර්ථකව පවත්වනු ලැබීය. සම්මේලනය සඳහා මධ්‍යම කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද දේශපාලන ඉදිරි දර්ශනය ගැන ඇති වූ උණුසුම් සාකච්ඡාවකින් පසුව සම්මේලනයට පැමිණි සිටි නියෝජිතයින් විසින් වැඩි ඡන්දයෙන් අනුමත කරන ලදී. එහි දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග නව ලිබරල් වාදය කරපින්නා ගත් මාලිමා ආණ්ඩුවේ ධනේෂ්වර ගැති ස්වභාවය හා එහි ගමන් මග, ආර්ථික අර්බුදයේ ස්වභාවය හා ඊට සමාජවාදි විසඳුම්, කම්කරු පංතිය හා වෘත්තීය සමිති ව්‍යාපාරය මුහුණ දෙන අභියෝග, ජාතික ප්‍රශ්නය විසඳීමේ ප්‍රවේශය වන ස්වයංනීර්න අයිතිය හා විප්ලවවාදි පක්ෂය ගොඩනැගීමේ අභියෝග යන කරුණු සාකච්ඡාවට භාජනය විය. සමග ජාත්‍යන්තර පරිමානව පංති අරගලයේ නව හැඩ ගැසිම් හා විප්ලවවාදින්ගේ කාර්‍යභාරය ගැන ඔහු විසින් ඉදිරිපත් කරන ලද දේශපාලන විග්‍රහය සමගිනී. ලෝක ආර්ථික අර්බුදය සමග ජාත්‍යන්තර පරිමානව දිග හැරෙමින් පවතින පංති අරගලය සම්බන්ධව ගැඹුරු සාකච්ඡාවක් සම්මේලන නියෝජිතයින් අතර ඇති විය. ඉන් අනතරුව පක්ෂය ගොඩනැගීමේ සාකච්ඡාව සමග තරුණ අංශය ගොඩනැගම කම්කරු පංතිය තුළ අපගේ කාර්‍ය භාරය හා රතුතරුව පුවත්පත ගොඩනැගීම යන කරුණු පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡාවට බඳුන් විය. සම්මේලනයේ න්‍යාය පත්‍රයේ අවසන් කටයුත්ත වූයේ ඉදිරි දෙවසර සඳහා මධ්‍යම කාරක සභාවට නියෝජිතයින් තෝරා ගැනීම ය. ඒ සඳහා ඉදිරිපත් වූ නාම යෝජනා ගැන සාකච්ඡාවෙන් අනතුරුව පක්ෂයේ කටයුතු ඉදිරිට ගෙන යාම සඳහා මධ්‍යම කාරක සභාවට සහෝදරවරු නිතරග යෙන් පත් කෙරින. මෙම සම්මේලනය




**කම්කරු ජාතනයන්තරයක් සඳහා කමිටුවේ ලේකම් ටෝනි සනුවා සහෝදරයා සම්මේලනය අමතමින්...**

සම්මේලනයේ කටයුතු ආරම්භ කෙරෙුනේ ධනපති ක්‍රමයේ අර්බුදය ජාත්‍යන්තර දේශපාලන ගමන් මග ගැන කම්කරු ජාත්‍යන්තරයක් සඳහා කමිටුවේ ලේකම් ටෝනි සනුවා සහෝදරයා අමෙරිකානු හා ඉරාන යුද්ධය, රුසියාව හා යුක්‍රේන යුද්ධය සඳහා කම්කරු ජාත්‍යන්තරයක් සඳහා කමිටුව නියෝජනය කරමින් ඉන්දියාව හා මැලේසියාව යන රටවල නියෝජිතයින්ද සහභාගී විය.

අප හා සම්බන්ධ වීමට ඔබත් කූපනය පුරවා එවන්න

නම : ..........
ලිපිනය : ..........
..........
රැකියාව : ..........
දුරකථනය : ..........

53/6, ඊ.ඩී.දාබරේ මාවත
නාරාහේන්පිට,
කොළඹ 5

එක්සත් සමාජවාදී පක්ෂය
ஐச்;ச்ல்ஹ சழ்ட்ழ்ஹல்ன;ப்; ச்ப்;ழ்ல்
United Socialist Party

සමාජවාදී පොත් පියස



කාලීන හා ඓතිහාසික වැදගත් කමකින් යුක්ත සිංහල, දෙමළ, හා ඉංග්‍රිසි පොත් පත් සමාජවාදී පොත් පියසෙන් ලබා ගත හැක. සමාජවාදී පොත් පියස විසින් පවත්වා ගෙන යනු ලබන පුස්ථකාලයේ පොත් පරිහරණය කිරීමටද අවස්ථාව පාඨකයින්හට විවෘතව පවතී.

විමසීම් - 011 2504647

ලිපිනය - 53/6 ඊ.ඩී.දාබරේ මාවත, නාරාහේන්පිට, කොළඹ 05

එම් කේ පියරත්න වන මා විසින් මරදානේ ජයන්ත වීරසේකර මාවතේ අංක 47 හි පිහිටි ස්ටාර් පබ්ලිකේෂන් මුද්‍රණාලයෙහිදී මුද්‍රණය කරන ලදී